රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 06/2006

මගේ අංකය ආ5/1/26,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2006.04.25

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 2006 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම

රජය විසින් 2006 අයවැය කථාව මගින් ප්‍රකාශිත පරිදි රජයේ සේවකයන් සඳහා ඇමුණුම 1 හි දක්වෙන ආකාරයට මාසික පදනමක් මත සකස් කරන ලද නව වැටුප් ව්‍යුහය 2006.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබේ.

### 02 තනතුරු/සේවාවන් ප්‍රතිවර්ගීකරණය හා නැවත කාණ්ඩගත කිරීම

නව වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කරනු පිණිස රජයේ සියළුම තනතුරු ඇමුණුම් II හි සඳහන් නිර්වචනයන් පදනම් කොටගෙන **'නව වැටුප් පරිවර්තන සූචිය'** නම් වූ ඇමුණුම III හි සඳහන් පරිදි ප්‍රතිවර්ගීකරණයට හා නැවත කාණ්ඩගත කිරීමට භාජනය කළ යුතුය.

ඇමුණුම III හි සඳහන් සූචියෙහි ඇතුළත් නොවූ තනතුරු / සේවාවන් වේ නම් අදාළ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව විසින් ඇමුණුම II හි නිර්වචනයනට අනුකූලව එම සේවාවන්/තනතුරු සම්බන්ධ වූ ස්වකීය යෝජනා සුදුසු නිර්දේශ ලබා දෙනු පිණිස ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත නොපමාව යොමු කළ යුතුය.

### 03 වැටුප් පරිවර්තනය

වර්තමාන වැටුප් ක්‍රමයෙහි සිට නව වැටුප් ක්‍රමයට රජයේ නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කළ යුත්තේ පහත සඳහන් අන්දමින් පියවරෙන් පියවර ක්‍රමයටයි.

පියවර (1) ඉහත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි සේවා කාණ්ඩ/ගණ අතුරින් එක් එක් නිලධාරියාට යෝග්‍ය වන සේවා කාණ්ඩය/ගණය තෝරා නිලධාරියා අදාළ සේවා කාණ්ඩයට/ගණයට අන්තර්ග්‍රහණය කළ යුතුයි. අනතුරුව නිලධාරියාගේ වර්තමාන ශ්‍රේණිය පදනම් කොට ගෙන එම සේවා කාණ්ඩය / ගණය තුළ අදාළ ශ්‍රේණියෙහි නිලධාරියා පිහිටුවිය යුතුය.

පියවර II) ඉන්පසු එක් එක් නිලධාරියා සිය වර්තමාන ශ්‍රේණියෙහි ලබමින් සිටින වැටුප් පියවරේ අනුරූපී වැටුප් පරිමාණයෙහි නියමිත පියවරේ තැබිය යුතුය.

කිසියම් සේවාවකට ඇතුලත් සියලුම ශ්‍රේණීන්ට/පන්තිනට හිමි වැටුප් පරිමාණයන් මෙම චක්‍රලේඛයෙහි අඩංගු වන විවිධ සේවා කාණ්ඩ/ගණ සඳහා නිර්දේශිත කේවල වැටුප් පරිමාණයන්හි ඇතුලත් වන බව සටහන් කර ගත යුතුය.

උදාහරණය :-

එම්.එන්. 2–2006 වැටුප් පරිමාණය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තිය, II පන්තිය හා I පන්තියට පහත සඳහන් පරිදි අදාල වේ.

| | වැටුප් පියවර | |
|---|---|---|
| III පන්තිය | 13640/- | මාසික |
| II පන්තිය | 14980/- | මාසික |
| I පන්තිය | 16590/- | මාසික |

මෙහි ඇමුණුම II හි සඳහන් නිර්වචනයන්හි අඩංගු සුදුසුකම් මෙහි දක්වා ඇත්තේ හුදෙක්ම මග පෙන්වීම සඳහා වන අතර එම සුදුසුකම් ලබා ඇති එහෙත් අදාල තනතුරකට විධිමත් පත්වීමක් නොලද කිසිදු තැනැත්තෙකු අදාල වැටුප් පරිමාණයට හිමිකම් නොලබයි.

තමන් දැනට දරන ශ්‍රේණියේ සිට ඊළඟ ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ උසස්වීමක් ලබා නොමැති තැනැත්තන්ට එකී ඉහළ ශ්‍රේණියට අයත් වැටුප් තලය ලැබීමට හිමිකම් නොමැත. එබඳු තැනැත්තන් පිහිටු විය යුත්තේ අදාල වැටුප් පරිමාණය දක්වෙන තීරුවට යාබදව **"උසස් කරනු නොලැබී නම්"** යනුවෙන් ශීර්ෂගත තීරුවෙහි සඳහන් වැටුප් පියවරයන්හි පමණි.

මෙහි පහත 6-අ ඡේදයේ සඳහන් දීමනා ද ඇතුළුව 2005 දෙසැම්බර් මාසයේ ගෙවූ වැටුප සහ යෝජිත වැටුප අතර වෙනසින් සියයට 50 ක් (50%) 2006.01.01 දින සිට ගෙවිය යුතුය. ඉතිරි 50% ගෙවිය යුත්තේ 2007.01.01 දින සිටය. පරිවර්තනය කිරීමේ ලිපිය මෙහි ඇමුණුම iv හි සඳහන් ආකෘතිය පරිදි නිකුත් කළ යුතුය.

2004.12.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 මගින් යෝජිත වැටුප් වැඩිවීම මෙම චක්‍රලේඛයෙහි අඩංගු වන නව වැටුප් පරිමාණවලට අන්තර්ගත කරනු ලැබ තිබේ. 2006.01.12 දිනැති අංක. 01/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සහ 2006.02.06 දින අංක. 01/2006 (1) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි ගෙවන ලද වැටුප මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් පරිමාණයන් ගෙවීමේ දී අයකර ගත යුතුය.

## 04 ජීවන වියදම් දීමනාව

අ. සියලුම රජයේ සේවකයිනට 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මසකට රු: 1000/- ක ජීවන වියදම් දීමනාවක් හිමිකර දෙනු ලැබේ. එදින සිට මෙම දීමනාව ගෙවිය යුතු අතර, සෑම වර්ෂයකම ජූනි මස 30 වන දිනෙන් හා දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන සය මසක කාලපරිච්ඡේදයක් අවසානයේ දී ජීවන වියදම් දර්ශකයෙහි අඩු/වැඩි වීමේ එක් ඒකකයකට රු: 2.50 වන පදනමින් එම දීමනාව නැවත ගණනය කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඒ ඒ අවස්ථාවල නිකුත් කරනු ඇත.

ආ. දෛනික වැටුප් ලබන සේවකයනට ද දිනකට රු: 34/- බැගින් වන පරිදි මසකට රු: 1000/- ක උපරිමයකට යටත්ව මෙම දීමනාව ගෙවිය යුතුය.

## 05 දෛනික වේතනය

අනියම්/දෛනික වැටුප්ලාභී පදනම මත සේවය කරන සේවකයින්ට ගෙවනු ලබන දෛනික වේතන ඒ ඒ සේවක ගණයේ මාසික ආරම්භක වැටුප 30 න් බෙද ගණනය කළ යුතුය. ඔවුන්ට 2005.12.31 දින ගෙවන ලද දෛනික වැටුප හා නව දෛනික වැටුප අතර වෙනසින් 50% ක් 2006.01.01 දින සිට ද සම්පූර්ණ දෛනික වැටුප 2007.01.01 දින සිට ද ගෙවිය යුතුය.

## 06 දීමනා සහ දිරිකාරකයන්

අ. 2000.09.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 15/2000 සහ 2001.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 24/2001 මගින් ලබා දී ඇති අතුරු දීමනාවන් නව වැටුප් පරිමාණයන්හි අන්තර්ගත කර ඇත. එහෙයින් එම දීමනා ගෙවීම 2006.01.01 දින සිට නැවැත්විය යුතුය.

ආ. දැනට වැටුපට අමතරව මාසික වැටුපෙන් තුනෙන් එකක (1/3) දීමනා ගෙවන ආයතන එකී දීමනාව 2005.12.31 දින වන විට ගෙවන ලද දීමනාවට සීමාකර තැබිය යුතුය.

එම ආයතනවලට 2006.01.01 දින සිට පත් කරනු ලබන හෝ ස්ථාන මාරු කරනු ලබන නිලධාරින්ට මෙම දීමනාව ගණනය කිරීමේ දී ඔවුන් 2005.12.31 දිනට ඇත්ත වශයෙන්ම ලැබූ දීමනා රහිත වැටුප හෝ කල්පිත පදනමින් එදිනට ලැබිය හැකිව තිබූ වැටුප අදාළ පරිදි යොද ගත යුතුය.

ඇ. අනිකුත් සියලුම දීමනා හා දිරිකාරක ගෙවීම් පිළිබඳව මෙම අමාත්‍යාංශය මගින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කරනු ඇත.

## 07 ස්ථානික දීමනාව

ඒ ඒ නිලධාරියාට ගෙවනු ලබන වැටුපෙන් 8% බැගින් ස්ථානික දීමනාව ගණනය කළ යුතුය.

## 08 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා අය කිරීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රාථමික හා ද්විතීය මට්ටම් | 6% |
| තෘතීය හා ජ්‍යෙෂ්ඨ මට්ටම් | 7% |

**09 අතිකාල ගෙවීම්**

අතිකාල ගෙවීම් ගණනය කළ යුත්තේ 2006.01.01 දින සිට ගෙවනු ලබන වැටුප පදනම් කොට ගෙනය.

**10 කාර්යක්ෂමතා කඩඉම**

සංශෝධිත/නව සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි ක්‍රියාත්මක වන තෙක් දැනට පවත්නා කාර්යක්ෂමතා කඩඉම්, නව වැටුප් පරිමාණවල අනුරූපී වැටුප් පියවරවල දී ක්‍රියාත්මක විය යුතුය.

**11 සේවක ශ්‍රේණි**

2006.01.01 දින සිට සේවක ශ්‍රේණිගත කිරීම (වර්ගීකරණ) පහත සඳහන් පරිදි වනු ඇත. 2003.12.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 15/2003 හි දක්වා තිබූ සේවක වර්ගීකරණය ඒ අනුව අවලංගු වේ.

- ප්‍රාථමික ශ්‍රේණිය
- ද්විතිය ශ්‍රේණිය
- මාණ්ඩලික ශ්‍රේණිය

ඇමුණුම II හි සඳහන් ප්‍රාථමික මට්ටමේ සියලු තනතුරු ප්‍රාථමික ශ්‍රේණියට ඇතුලත් වේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද විමසා විශේෂ කොට දක්වනු ලබන අධීක්ෂණ කාර්යයන් පවරනු ලැබ ඇති තනතුරු හැර ද්විතිය මට්ටමේ අනිකුත් සියලු තනතුරු ද්විතිය ශ්‍රේණියට ඇතුලත් වේ.

ඉහත සඳහන් පරිදි අධීක්ෂණ කාර්යයන් පවරනු ලැබ ඇති ද්විතිය මට්ටමේ තනතුරු ද තෘතිය මට්ටම හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියලු තනතුරු ද මාණ්ඩලික ශ්‍රේණියට ඇතුලත් වේ.

කෙසේ වෙතත් මාණ්ඩලික ශ්‍රේණි පිළිබඳ ඉහත නිර්වචනයට ඇතුලත් නොවන කිසියම් තනතුරක් දැනට මාණ්ඩලික ශ්‍රේණියට ඇතුලත් වී ඇත්නම් එවැනි තනතුරු තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහි ලා සලකනු ලැබේ.

**12 සංයුක්ත දීමනාව**

සංයුක්ත දීමනාව පහත දැක්වෙන පරිද්දෙන් 2006.01.01 දින සිට ප්‍රතිශෝධන කෙරේ.

| සේවක ශ්‍රේණිය | මුදල |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | රු: 350/- |
| ද්විතිය ශ්‍රේණිය | රු: 400/- |
| මාණ්ඩලික ශ්‍රේණි | රු: 500/- |

13. දුම්රිය බලපත්‍ර සහ නිවාඩු ගමන්

- ප්‍රාථමික ශ්‍රේණිය - 2 වැනි පංතිය
- ද්විතීය ශ්‍රේණිය - 1 වැනි පංතිය
- මාණ්ඩලික ශ්‍රේණිය - 1 වැනි පංතිය

14. වැටුප් වර්ධක දිනය

ඊළඟ උසස්වීමේ දිනය තෙක් වැටුප් වර්ධක දිනය නොවෙනස්ව පවතිනු ඇත.

15 කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයෙහි යෙදවූ නිලධාරීන්ගේ සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩල දීමනා

15.1 විශ්‍රාම ලැබීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවා ඇති නිලධාරීන්

විශ්‍රාම ලැබීමෙන් පසු 2003.01.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 1/2003 විධිවිධාන පරිදි නැවත සේවයෙහි යොදවා ඇති සේවකයින්ගේ දීමනා ද නව වැටුප් පරිමාණයන් පදනම් කර ගෙන ගණනය කළ යුතු අතර, 3 ඡේදයේ සඳහන් සීමාවන්ට යටත්ව ගෙවීම් කළ යුතුය. රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් පසු නැවත සේවයේ යොදවා ඇති නිලධාරීනට විශ්‍රාම වැටුප සමග මසකට රු: 500/- ක ජීවන වියදම් දීමනාවක් ගෙවන බැවින් අදාළ ආයතන මගින් ඔවුනට ගෙවිය යුත්තේ මසකට රු: 500/- බැගින් වූ වෙනස පමණි.

15.2 කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති නිලධාරීන්

කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යොදවා ඇති පුද්ගලයින්ගේ වැටුප පවත්නා කොන්ත්‍රාත් කාලසීමාව තුළ සංශෝධනය නොකළ යුතුය.

15.3 ව්‍යාපෘති කාර්ය මණ්ඩලවල වැටුප්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද විමසා සමාලෝචනය කොට පසුව දැනුම් දෙනු ඇත.

16. ණය මුදල් සහ වැටුප් අත්තිකාරම්

අ. ආපදා ණය 2004.11.30 දින නියම වශයෙන්ම ලද දීමනා රහිත වැටුප පදනම් කර ගෙන ගණනය කළ යුතුය.

ආ. නිවාස හා දේපළ ණය හා වාහන ණය එක් එක් සේවකයාට ගෙවනු ලබන නව වැටුප පදනම් කර ගෙන ගණනය කළ යුතුය.

17. අ. විශ්‍රාම වැටුප්

2000.09.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 15/2000 සහ 2001.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 24/2001 ප්‍රකාරව විශ්‍රාමිකයින්ට ගෙවිය යුතු අතුරු දීමනාවන් 2006.01.01 දින සිට ඔවුන්ගේ මාසික විශ්‍රාම වැටුප සමග ඒකාබද්ධ කළ යුතුය.

2004.11.30 වැනි දින හෝ ඊට පෙරාතුව විශ්‍රාම ලබා ඇති විශ්‍රාමිකයින්ට 2006.01.01 දින සිට ඔවුන්ගේ අඩු නොකළ විශ්‍රාම වැටුප මත 10% ක (සියයට දහයක) වැඩිවීමක් රු: 500/- අවමයකට සහ රු: 1250/- ක උපරිමයකට යටත්ව පහත දක්වා ඇති පරිදි ඒකාබද්ධ කොට ගෙවිය යුතුය.

ආ. **විශ්‍රාමිකයන් සඳහා ජීවන වියදම් දීමනාව**

සියලුම විශ්‍රාමිකයින්ට මසකට රු: 500/- ක් වූ පාදක අගයක් පදනම් කර ගත් ජීවන වියදම් දීමනාවක් 2006.01.01 දින සිට ගෙවිය යුතුයි. මෙම ජීවන වියදම් දීමනාව ද රජයේ සේවකයිනට අදාළ වන පදනම මත ප්‍රතිගණනය කරනු ලැබේ.

## 18. රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩල

මෙම චක්‍රලේඛයෙහි සඳහන් වැටුප් ප්‍රතිශෝධනය සහ දීමනාවන් සංස්ථා අංශයට අදාළ කරවීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද විමසා වෙනම උපදෙස් නිකුත් කරනු ඇත.

## 19. සාමාන්‍ය කරුණු

අ. **පත් කිරීමේ දී / උසස් කිරීමේ දී වැටුප**

2006.01.01 දින සිට 2006.12.31 දින දක්වා නිකුත් කෙරෙන නව පත්වීම් හෝ උසස්වීම් ලිපිවල ද නිලධාරියා අයත් වන සේවාව / තනතුරට හිමි වැටුප් පරිමාණය සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතුය. ශ්‍රේණිගත උසස්වීමක දී පත්වීම් ලිපිවල උසස් කෙරෙන ශ්‍රේණියට අදාළ ආරම්භක වැටුප සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් කළ යුත්තේ මෙම චක්‍රලේඛයේ සඳහන් සියලු කොන්දේසිවලට යටත්වය.

ආ. **විශ්‍රාම ගැනීමේ දී ගෙවන වැටුප**

2006.01.01 දින සිට 2006.12.31 දින අතර තුළ දී විශ්‍රාම ගන්වනු ලබන සේවකයින්ගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ සඳහන් සීමාවන්ට යටත්ව ඔවුනට හිමිවන සම්පූර්ණ වැටුප සැළකිල්ලට ගත යුතු වේ.

ඇ. **සන්නද්ධ සේවා**

සියලුම "සන්නද්ධ සේවාවල" (පොලීසිය හැර) වැටුප් පරිමාණයන් මෙම චක්‍රලේඛයෙහි ඇතුළත් කරනු ලැබ නොමැති බව සටහන් කර ගත යුතුය. මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද විමසා වෙනම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ඇත.

ඈ. අමාත්‍යවරුන්ගේ (කැබිනට්, කැබිනට් නොවන සහ නියෝජ්‍ය) පෞද්ගලික කාර්ය මණ්ඩලයේ වැටුප් :-

| | | |
|---|---|---|
| පෞද්ගලික ලේකම් | - | මසකට රු: 23000/- |
| සම්බන්ධීකරණ ලේකම්<br>මහජන සම්බන්ධතා නිලධාරි<br>මාධ්‍ය ලේකම් | - | මසකට රු: 22250/- |

ඉ. වාර්ෂික වැටුප් වැඩිවීම්

නව වැටුප් පරිමාණයන්හි අඩංගු වැටුප් වර්ධකයන්හි මූල්‍යමය අගය අදාළ සේවාවෙහි වර්තමාන වැටුප් වර්ධකයන්ගේ මූල්‍යමය අගයට අඩුවන අවස්ථාවන්හි දී, එකී සේවාවනට අයත් සේවකයන් අතුරින් දැනට වැඩි මූල්‍යමය අගයක වැටුප් වර්ධකයන් හිමිව සිටින සේවකයනට පමණක්, ඔවුන්ගේ වර්තමාන වැටුප් වර්ධක අගය හා නව වැටුප් වර්ධක අගය අතර වෙනස 'ගැලපීමේ දීමනාවක්' වශයෙන් ඔවුනට පෞද්ගලික වන සේ අඩු මූල්‍යමය අගය සහිත වැටුප් වර්ධකය සමග, ඔවුන් වෙනත් ශ්‍රේණියකට/සේවාවකට උසස් කරණු/පත් කරණු ලබන තෙක් ගෙවිය යුතුය. මෙම 'ගැලපීමේ දීමනාව' සියලු කාර්යයන් සඳහා වැටුපෙහි ඇතුළත් කොටසක් වශයෙන් සැලකිය යුතුය.

20. රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනය

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙහි නිශ්චිත නිර්දේශයන්ගෙන් තොරව රාජ්‍ය සේවයේ කිසිදු තනතුරක/සේවයක වැටුප් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතුය.

21. වැඩිපුර ගෙවීම්

මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීමේ හේතුවෙන් හෝ ලියවිලිවල හෝ ගණනය කිරීමේදී ඇති වන වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් නිලධාරියෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධාරියා බැඳී සිටින බවත් සටහන් කර ගත යුතුය.

22. පැහැදිලි කර ගැනීම් හා වැඩිදුර උපදෙස්

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ස්ථාවර ආයතනයක් වන අතර, මෙම චක්‍රලේඛ විධිවිධානයන් ක්‍රියාත්මක වීම පිළිබඳව එම සභාව විසින් අඛණ්ඩව සමාලෝචනයක යෙදෙනු ඇත. එසේම කිසියම් රාජ්‍ය ආයතනයක් විසින් තවදුරටත් විස්තර කිරීම්, පැහැදිලි කර ගැනීම් හා වැඩිදුර උපදෙස් ඇතුළු සහායක් අපේක්ෂා කරන්නේ නම් එබඳු ඉල්ලීම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට යොමු කළ යුතු වේ.

23. මූල්‍ය ප්‍රතිපාදන

අයවැය සංකේත 1001 "වැටුප් හා වේතන" යටතේ ඇති ප්‍රතිපාදන වලින් මෙම වැටුප් වැඩිවීම ගෙවිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන ලබාගනු පිණිස ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

24. අවලංගු කරණු ලබන චක්‍රලේඛ

2006.01.12 දින අංක. 01/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2006.02.06 දින අංක. 01/2006 (1) දරන චක්‍රලේඛය මෙමගින් අවලංගු කෙරේ.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

**ඩී.දිසානායක**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යංශය**

| New Salary Structure for Public Servants | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | Initial | Yrs | 1st slab | Yrs | 2nd slab | Yrs | 3rd slab | Yrs | 4th slab | Yrs | 5th slab | Maximum |
| PL 1-2006 | 11,730 | 10 | 100 | 10 | 110 | 10 | 120 | 12 | 130 | | | 16,590 |
| PL 2-2006 | 12,140 | 10 | 110 | 10 | 120 | 10 | 130 | 12 | 140 | | | 17,420 |
| PL 3-2006 | 12,360 | 10 | 110 | 10 | 120 | 10 | 130 | 12 | 140 | | | 17,640 |
| MN 1-2006 | 12,920 | 10 | 120 | 11 | 140 | 10 | 210 | 10 | 290 | | | 20,660 |
| MN 2-2006 | 13,640 | 10 | 120 | 11 | 140 | 6 | 210 | 14 | 290 | | | 21,700 |
| MN 3-2006 | 14,510 | 4 | 150 | 6 | 205 | 20 | 290 | 11 | 320 | | | 25,660 |
| MN 4-2006 | 14,850 | 10 | 185 | 4 | 210 | 15 | 290 | 7 | 320 | | | 24,130 |
| MN 5-2006 | 15,785 | 10 | 290 | 15 | 325 | 11 | 400 | - | - | | | 27,960 |
| MN 6-2006 | 16,920 | 10 | 290 | 15 | 325 | 11 | 400 | | | | | 29,095 |
| MN 7-2006 | 19,755 | 15 | 325 | 11 | 400 | | | | | | | 29,030 |
| MT 1-2006 | 14,000 | 10 | 120 | 11 | 140 | 6 | 210 | 14 | 290 | | | 22,060 |
| MT 2-2006 | 14,140 | 10 | 140 | 11 | 150 | 6 | 210 | 14 | 290 | | | 22,510 |
| MT 3-2006 | 14,420 | 10 | 140 | 11 | 150 | 6 | 210 | 14 | 290 | | | 22,790 |
| MT 4-2006 | 14,630 | 7 | 150 | 9 | 240 | 10 | 290 | 15 | 320 | | | 25,540 |
| MT 5-2006 | 14,780 | 7 | 150 | 9 | 240 | 10 | 290 | 15 | 320 | | | 25,690 |
| MT 6-2006 | 14,930 | 7 | 150 | 9 | 240 | 10 | 290 | 15 | 320 | | | 25,840 |
| MT 7-2006 | 15,080 | 7 | 150 | 9 | 240 | 10 | 290 | 15 | 320 | | | 25,990 |
| MT 8-2006 | 23,940 | 10 | 650 | 8 | 715 | | | | | | | 36,160 |
| SL 1-2006 | 22,935 | 10 | 645 | 8 | 790 | 17 | 1,050 | | | | | 53,555 |
| SL 2-2006 | 25,515 | 4 | 645 | 8 | 650 | 16 | 1,050 | | | | | 50,095 |
| SL 3-2006 | 42,390 | 12 | 1,310 | | | | | | | | | 58,110 |
| SL 4-2006 | 47,515 | 12 | 1,425 | | | | | | | | | 64,615 |
| SL 5-2006 | 28,095 | 5 | 645 | 5 | 790 | 15 | 1,050 | | | | | 51,020 |
| SL 6-2006 | 28,740 | 5 | 645 | 10 | 790 | 13 | 1,050 | | | | | 53,515 |
| SL 7-2006 | 51,665 | 5 | 1,310 | | | | | | | | | 58,215 |
| SL 8-2006 | 54,285 | 5 | 1,310 | | | | | | | | | 60,835 |
| TS 1-2006 | 12,920 | 10 | 120 | 5 | 150 | | | | | | | 14,870 |
| TS 2-2006 | 13,790 | 9 | 150 | 6 | 210 | 5 | 300 | 8 | 350 | 12 | 645 | 28,440 |
| TS 3-2006 | 15,350 | 5 | 210 | 5 | 300 | 8 | 350 | 19 | 645 | | | 32,955 |
| MP 1-2006 | 16,360 | 12 | 290 | 13 | 320 | 10 | 460 | | | | | 28,600 |
| MP 2-2006 | 26,660 | 10 | 650 | 7 | 715 | | | | | | | 38,165 |
| RS 1-2006 | 13,880 | 7 | 120 | 10 | 150 | 17 | 210 | | | | | 19,790 |
| RS 2-2006 | 15,350 | 7 | 150 | 2 | 210 | 8 | 290 | 17 | 325 | | | 24,665 |
| SF 1-2006 | 63,500 | | Fixed | | | | | | | | | |
| SF 2-2006 | 65,000 | | Fixed | | | | | | | | | |
| SF 3-2006 | 67,000 | | Fixed | | | | | | | | | |
| SF 4-2006 | 70,000 | | Fixed | | | | | | | | | |

| Category | | | | Primary Level- Unskilled | | | | Primary Level- Semi skilled | | | | Primary Level- Skilled | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | | | | PL 1-2006 | | | | PL 2-2006 | | | | PL 3-2006 | | | |
| Time scale for promotion & Increments | | | | Recruitment | If not promoted to II | If not promoted to I | If not promoted to Spl | Recruitment | If not promoted to II | If not promoted to I | If not promoted to Spl | Recruitment | If not promoted to II | If not promoted to I | If not promoted to Spl |
| Number of Years | Average Performer | Exceptional Performer | Grade | 100 | 100 | | | 110 | 110 | | | 110 | 110 | | |
| | | | | 10 | 8 | | | 10 | 8 | | | 10 | 8 | | |
| | | | | 110 | | 110 | | 120 | | 120 | | 120 | | 120 | |
| | | | | 10 | | 5 | | 10 | | 4 | | 10 | | 4 | |
| | | | | 120 | | | 120 | 130 | | 130 | 130 | 130 | | 130 | 130 |
| | | | | 10 | | | 5 | 10 | | 1 | 5 | 10 | | 1 | 5 |
| | | | | 130 | | | | 140 | | | | 140 | | | |
| | | | | 12 | | | | 12 | | | | 12 | | | |
| 1 | 1 | 1 | III | 11,730 | | | | 12,140 | | | | 12,360 | | | |
| 2 | 2 | 2 | | 11,830 | | | | 12,250 | | | | 12,470 | | | |
| 3 | 3 | 3 | | 11,930 | | | | 12,360 | | | | 12,580 | | | |
| 4 | 4 | 4 | | 12,030 | | | | 12,470 | | | | 12,690 | | | |
| 5 | 5 | 5 | | 12,130 | | | | 12,580 | | | | 12,800 | | | |
| 6 | 6 | 6 | | *12,230* | | | | *12,690* | | | | *12,910* | | | |
| 7 | 7 | | | *12,330* | | | | *12,800* | | | | *13,020* | | | |
| 8 | 8 | | | *12,430* | | | | *12,910* | | | | *13,130* | | | |
| 9 | 9 | | | *12,530* | | | | *13,020* | | | | *13,240* | | | |
| 10 | 10 | | | *12,630* | | | | *13,130* | | | | *13,350* | | | |
| 11 | | | | *12,730* | | | | *13,240* | | | | *13,460* | | | |
| **12** | **11** | 7 | II | 12,840 | 12,830 | | | 13,360 | 13,350 | | | 13,580 | 13,570 | | |
| 13 | 12 | 8 | | 12,950 | 12,930 | | | 13,480 | 13,460 | | | 13,700 | 13,680 | | |
| 14 | 13 | 9 | | 13,060 | 13,030 | | | 13,600 | 13,570 | | | 13,820 | 13,790 | | |
| 15 | 14 | 10 | | 13,170 | 13,130 | | | 13,720 | 13,680 | | | 13,940 | 13,900 | | |
| 16 | 15 | 11 | | 13,280 | 13,230 | | | 13,840 | 13,790 | | | 14,060 | 14,010 | | |
| 17 | 16 | 12 | | 13,390 | 13,330 | | | 13,960 | 13,900 | | | 14,180 | 14,120 | | |
| 18 | 17 | 13 | | 13,500 | 13,430 | | | 14,080 | 14,010 | | | 14,300 | 14,230 | | |
| 19 | 18 | 14 | | 13,610 | 13,530 | | | 14,200 | 14,120 | | | 14,420 | 14,340 | | |
| 20 | 19 | | | 13,720 | | | | 14,320 | | | | 14,540 | | | |
| 21 | | | | 13,830 | | | | 14,440 | | | | 14,660 | | | |
| **22** | **20** | **15** | I | 13,950 | | 13,940 | | 14,570 | | 14,560 | | 14,790 | | 14,780 | |
| 23 | 21 | 16 | | 14,070 | | 14,050 | | 14,700 | | 14,680 | | 14,920 | | 14,900 | |
| 24 | 22 | 17 | | 14,190 | | 14,160 | | 14,830 | | 14,800 | | 15,050 | | 15,020 | |
| 25 | 23 | 18 | | 14,310 | | 14,270 | | 14,960 | | 14,920 | | 15,180 | | 15,140 | |
| 26 | 24 | 19 | | 14,430 | | 14,380 | | 15,090 | | 15,050 | | 15,310 | | 15,270 | |
| 27 | 25 | 20 | | 14,550 | | | | 15,220 | | | | 15,440 | | | |
| 28 | 26 | 21 | | 14,670 | | | | 15,350 | | | | 15,570 | | | |
| 29 | **27** | **22** | | 14,790 | | | | 15,480 | | | | 15,700 | | | |
| **30** | 28 | 23 | | 14,910 | | | | 15,610 | | | | 15,830 | | | |
| 31 | | | | 15,030 | | | | 15,740 | | | | 15,960 | | | |
| 32 | 29 | 24 | **Spl** | 15,160 | | | 15,150 | 15,880 | | | 15,870 | 16,100 | | | 16,090 |
| **33** | **30** | **25** | | 15,290 | | | 15,270 | 16,020 | | | 16,000 | 16,240 | | | 16,220 |
| 34 | 31 | 26 | | 15,420 | | | 15,390 | 16,160 | | | 16,130 | 16,380 | | | 16,350 |
| 35 | 32 | 27 | | 15,550 | | | 15,510 | 16,300 | | | 16,260 | 16,520 | | | 16,480 |
| 36 | **33** | **28** | | 15,680 | | | 15,630 | 16,440 | | | 16,390 | 16,660 | | | 16,610 |
| 37 | 34 | 29 | | 15,810 | | | | 16,580 | | | | 16,800 | | | |
| **38** | 35 | 30 | | 15,940 | | | | 16,720 | | | | 16,940 | | | |
| 39 | **36** | **31** | | 16,070 | | | | 16,860 | | | | 17,080 | | | |
| 40 | 37 | 32 | | 16,200 | | | | 17,000 | | | | 17,220 | | | |
| 41 | 38 | 33 | | 16,330 | | | | 17,140 | | | | 17,360 | | | |
| 42 | 39 | 34 | | 16,460 | | | | 17,280 | | | | 17,500 | | | |
| 43 | 40 | 35 | | 16,590 | | | | 17,420 | | | | 17,640 | | | |

Annexure I-2

| Category | | | | MA Non-tech Seg 2 | | | MA Non-tech Seg 1- Multi duty | | | MA Supervisory Non-Tech/ Tech | | | MA Tech - Seg 3 | | | MA Tech - Seg 2 | | | MA Tech - Seg 1 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | | | | MN 1-2006 | | | MN 2-2006 | | | MN 3-2006 | | | MT 1-2006 | | | MT 2-2006 | | | MT 3-2006 | | |
| Time scale for promotion & Increments | | | .. | Recruitment | If not promoted to II | If not promoted to I | Recruitment | If not promoted to II | If not promoted to I | Recruitment | If not promoted to II | If not promoted to I | Recruitment | If not promoted to II | If not promoted to I | Recruitment | If not promoted to II | If not promoted to I | Recruitment | If not promoted to II | If not promoted to I |
| Number of Years | Avarage Performer | Exceptional Performer | Grade | | | | | | | | | | | | | | | | | | |
| | | | | 120 | 120 | | 120 | 120 | | 150 | | | 120 | | | 140 | | | 140 | | |
| | | | | 10 | 4 | | 10 | 5 | | 4 | | | 10 | | | 10 | | | 10 | | |
| | | | | 140 | 140 | 140 | 140 | 140 | | 205 | | | 140 | 140 | 140 | 150 | | | 150 | | |
| | | | | 11 | 4 | 8 | 11 | 3 | | 6 | | | 11 | 8 | 8 | 11 | | | 11 | | |
| | | | | 210 | | | 210 | | 210 | 290 | | | 210 | | | 210 | | | 210 | | |
| | | | | 10 | | | 6 | | 7 | 20 | | | 6 | | | 6 | | | 6 | | |
| | | | | 290 | | | 290 | | | 320 | | | 290 | | | 290 | | | 290 | | |
| | | | | 10 | | | 14 | | | 11 | | | 14 | | | 14 | | | 14 | | |
| 1 | 1 | 1 | III | 12,920 | | | 13,640 | | | 14,510 | | | 14,000 | | | 14,140 | | | 14,420 | | |
| 2 | 2 | 2 | | 13,040 | | | 13,760 | | | 14,660 | | | 14,120 | | | 14,280 | | | 14,560 | | |
| 3 | 3 | 3 | | 13,160 | | | 13,880 | | | 14,810 | | | 14,240 | | | 14,420 | | | 14,700 | | |
| 4 | 4 | 4 | | 13,280 | | | 14,000 | | | 14,960 | | | 14,360 | | | 14,560 | | | 14,840 | | |
| 5 | 5 | 5 | | 13,400 | | | 14,120 | | | 15,110 | | | 14,480 | | | 14,700 | | | 14,980 | | |
| 6 | 6 | 6 | | 13,520 | | | 14,240 | | | 15,315 | | | 14,600 | | | 14,840 | | | 15,120 | | |
| 7 | 7 | | | 13,640 | | | 14,360 | | | 15,520 | | | 14,720 | | | 14,980 | | | 15,260 | | |
| 8 | 8 | | | 13,760 | | | 14,480 | | | 15,725 | | | 14,840 | | | 15,120 | | | 15,400 | | |
| 9 | 9 | | | 13,880 | | | 14,600 | | | 15,930 | | | 14,960 | | | 15,260 | | | 15,540 | | |
| 10 | 10 | | | 14,000 | | | 14,720 | | | 16,135 | | | 15,080 | | | 15,400 | | | 15,680 | | |
| 11 | | | | 14,120 | | | 14,840 | | | 16,340 | | | 15,200 | | | 15,540 | | | 15,820 | | |
| 12 | 11 | 7 | II | 14,260 | 14,240 | | 14,980 | 14,960 | | 16,630 | 16,490 | | 15,340 | 15,340 | | 15,690 | 15,680 | | 15,970 | 15,960 | |
| 13 | 12 | 8 | | 14,400 | 14,360 | | 15,120 | 15,080 | | 16,920 | 16,640 | | 15,480 | 15,480 | | 15,840 | 15,820 | | 16,120 | 16,100 | |
| 14 | 13 | 9 | | 14,540 | 14,480 | | 15,260 | 15,200 | | 17,210 | 16,790 | | 15,620 | 15,620 | | 15,990 | 15,960 | | 16,270 | 16,240 | |
| 15 | 14 | 10 | | 14,680 | 14,600 | | 15,400 | 15,320 | | 17,500 | 16,940 | | 15,760 | 15,760 | | 16,140 | 16,100 | | 16,420 | 16,380 | |
| 16 | 15 | 11 | | 14,820 | 14,740 | | 15,540 | 15,440 | | 17,790 | 17,090 | | 15,900 | 15,900 | | 16,290 | 16,240 | | 16,570 | 16,520 | |
| 17 | 16 | 12 | | 14,960 | 14,880 | | 15,680 | 15,580 | | 18,080 | 17,240 | | 16,040 | 16,040 | | 16,440 | 16,380 | | 16,720 | 16,660 | |
| 18 | 17 | 13 | | 15,100 | 15,020 | | 15,820 | 15,720 | | 18,370 | 17,390 | | 16,180 | 16,180 | | 16,590 | 16,520 | | 16,870 | 16,800 | |
| 19 | 18 | 14 | | 15,240 | 15,160 | | 15,960 | 15,860 | | 18,660 | 17,540 | | 16,320 | 16,320 | | 16,740 | 16,660 | | 17,020 | 16,940 | |
| 20 | 19 | 15 | | 15,380 | | | 16,100 | | | 18,950 | | | 16,460 | | | 16,890 | | | 17,170 | | |
| 21 | 20 | | | 15,520 | | | 16,240 | | | 19,240 | | | 16,600 | | | 17,040 | | | 17,320 | | |
| 22 | | | | 15,660 | | | 16,380 | | | 19,530 | | | 16,740 | | | 17,190 | | | 17,470 | | |
| 23 | 21 | 16 | I | 15,870 | | 15,800 | 16,590 | | 16,520 | 19,820 | | 19,735 | 16,950 | | 16,880 | 17,400 | | 17,340 | 17,680 | | 17,620 |
| 24 | 22 | 17 | | 16,080 | | 15,940 | 16,800 | | 16,730 | 20,110 | | 19,940 | 17,160 | | 17,020 | 17,610 | | 17,490 | 17,890 | | 17,770 |
| 25 | 23 | 18 | | 16,290 | | 16,080 | 17,010 | | 16,940 | 20,400 | | 20,145 | 17,370 | | 17,160 | 17,820 | | 17,640 | 18,100 | | 17,920 |
| 26 | 24 | 19 | | 16,500 | | 16,220 | 17,220 | | 17,150 | 20,690 | | 20,350 | 17,580 | | 17,300 | 18,030 | | 17,790 | 18,310 | | 18,070 |
| 27 | 25 | 20 | | 16,710 | | 16,360 | 17,430 | | 17,360 | 20,980 | | 20,555 | 17,790 | | 17,440 | 18,240 | | 17,940 | 18,520 | | 18,220 |
| 28 | 26 | 21 | | 16,920 | | 16,500 | 17,640 | | 17,570 | 21,270 | | 20,760 | 18,000 | | 17,580 | 18,450 | | 18,090 | 18,730 | | 18,370 |
| 29 | 27 | 22 | | 17,130 | | 16,640 | 17,930 | | 17,780 | 21,560 | | 20,965 | 18,290 | | 17,720 | 18,740 | | 18,240 | 19,020 | | 18,520 |
| 30 | 28 | 23 | | 17,340 | | 16,780 | 18,220 | | 17,990 | 21,850 | | 21,170 | 18,580 | | 17,860 | 19,030 | | 18,390 | 19,310 | | 18,670 |
| 31 | 29 | 24 | | 17,550 | | | 18,510 | | | 22,140 | | | 18,870 | | | 19,320 | | | 19,600 | | |
| 32 | 30 | 25 | | 17,760 | | | 18,800 | | | 22,460 | | | 19,160 | | | 19,610 | | | 19,890 | | |
| 33 | 31 | 26 | | 18,050 | | | 19,090 | | | 22,780 | | | 19,450 | | | 19,900 | | | 20,180 | | |
| 34 | 32 | 27 | | 18,340 | | | 19,380 | | | 23,100 | | | 19,740 | | | 20,190 | | | 20,470 | | |
| 35 | 33 | 28 | | 18,630 | | | 19,670 | | | 23,420 | | | 20,030 | | | 20,480 | | | 20,760 | | |
| 36 | 34 | 29 | | 18,920 | | | 19,960 | | | 23,740 | | | 20,320 | | | 20,770 | | | 21,050 | | |
| 37 | 35 | 30 | | 19,210 | | | 20,250 | | | 24,060 | | | 20,610 | | | 21,060 | | | 21,340 | | |
| 38 | 36 | 31 | | 19,500 | | | 20,540 | | | 24,380 | | | 20,900 | | | 21,350 | | | 21,630 | | |
| 39 | 37 | 32 | | 19,790 | | | 20,830 | | | 24,700 | | | 21,190 | | | 21,640 | | | 21,920 | | |
| 40 | 38 | 33 | | 20,080 | | | 21,120 | | | 25,020 | | | 21,480 | | | 21,930 | | | 22,210 | | |
| 41 | 39 | 34 | | 20,370 | | | 21,410 | | | 25,340 | | | 21,770 | | | 22,220 | | | 22,500 | | |
| 42 | 40 | 35 | | 20,660 | | | 21,700 | | | 25,660 | | | 22,060 | | | 22,510 | | | 22,790 | | |

| Category | | | | Associate Officers | | | | Field / Office Based Officers selected thro. Exam- Segment 2 | | Office / Field Based Officers Segment 1 | | | Office Admin. & Others |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | | | | MN 4-2006 | | | | MN 5-2006 | | MN 6-2006 | | | MN 7-2006 |
| Time scale for promotion & Increments | | | | Recruitment | If not promoted to II | If not promoted to I | | Recruitment | If not promoted to I | Recruitment | If not promoted to I | | MA Supra/Spl |
| Number of Years | Average Performer | Exceptional Performer | | 185 | 185 | | | 290 | | 290 | | | 325 |
| | | | | 10 | 4 | | | 10 | | 10 | | | 15 |
| | | | | 210 | | | | 325 | | 325 | | | 400 |
| | | | | 4 | | | | 15 | | 15 | | | 11 |
| | | | | 290 | | | | 400 | | 400 | | | |
| | | | | 15 | | | | 11 | | 11 | | | |
| | | | | 320 | | | | | | | | | |
| | | | | 7 | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | Grade | | | | | | | | | | |
| 1 | 1 | 1 | III | 14,850 | | | II | 15,785 | | 16,920 | | MN 1 | 19,755 |
| 2 | 2 | 2 | | 15,035 | | | | 16,075 | | 17,210 | | MN 2 | 20,080 |
| 3 | 3 | 3 | | 15,220 | | | | 16,365 | | 17,500 | | MT 3, 2 & 1 | 20,405 |
| 4 | 4 | 4 | | 15,405 | | | | 16,655 | | 17,790 | | MN 3 | 20,730 |
| 5 | 5 | 5 | | 15,590 | | | | 16,945 | | 18,080 | | | 21,055 |
| 6 | 6 | 6 | | 15,775 | | | | 17,235 | | 18,370 | | | 21,380 |
| 7 | 7 | | | 15,960 | | | | 17,525 | | 18,660 | | | 21,705 |
| 8 | 8 | | | 16,145 | | | | 17,815 | | 18,950 | | | 22,030 |
| 9 | 9 | | | 16,330 | | | | 18,105 | | 19,240 | | | 22,355 |
| 10 | 10 | | | 16,515 | | | | 18,395 | | 19,530 | | | 22,680 |
| 11 | | | | 16,700 | | | | 18,685 | | 19,820 | | | 23,005 |
| 12 | 11 | 7 | II | 16,910 | 16,885 | | I | 19,010 | 18,975 | 20,145 | 20,110 | | 23,330 |
| 13 | 12 | 8 | | 17,120 | 17,070 | | | 19,335 | 19,265 | 20,470 | 20,400 | | 23,655 |
| 14 | 13 | 9 | | 17,330 | 17,255 | | | 19,660 | 19,555 | 20,795 | 20,690 | | 23,980 |
| 15 | 14 | 10 | | 17,540 | 17,440 | | | 19,985 | 19,845 | 21,120 | 20,980 | | 24,305 |
| 16 | 15 | 11 | | 17,830 | | | | 20,310 | 20,135 | 21,445 | 21,270 | | 24,630 |
| 17 | 16 | 12 | | 18,120 | | | | 20,635 | 20,425 | 21,770 | 21,560 | | 25,030 |
| 18 | 17 | 13 | | 18,410 | | | | 20,960 | 20,715 | 22,095 | 21,850 | | 25,430 |
| 19 | 18 | 14 | | 18,700 | | | | 21,285 | 21,005 | 22,420 | 22,140 | | 25,830 |
| 20 | 19 | 15 | | 18,990 | | | | 21,610 | | 22,745 | | | 26,230 |
| 21 | 20 | | | 19,280 | | | | 21,935 | | 23,070 | | | 26,630 |
| 22 | | | | 19,570 | | | | 22,260 | | 23,395 | | | 27,030 |
| 23 | 21 | 16 | I | 19,860 | | 19,860 | | 22,585 | | 23,720 | | | 27,430 |
| 24 | 22 | 17 | | 20,150 | | 20,150 | | 22,910 | | 24,045 | | | 27,830 |
| 25 | 23 | 18 | | 20,440 | | 20,440 | | 23,235 | | 24,370 | | | 28,230 |
| 26 | 24 | 19 | | 20,730 | | 20,730 | | 23,560 | | 24,695 | | | 28,630 |
| 27 | 25 | 20 | | 21,020 | | 21,020 | | 23,960 | | 25,095 | | | 29,030 |
| 28 | 26 | 21 | | 21,310 | | | | 24,360 | | 25,495 | | | |
| 29 | 27 | 22 | | 21,600 | | | | 24,760 | | 25,895 | | | |
| 30 | 28 | 23 | | 21,890 | | | | 25,160 | | 26,295 | | | |
| 31 | 29 | 24 | | 22,210 | | | | 25,560 | | 26,695 | | | |
| 32 | 30 | 25 | | 22,530 | | | | 25,960 | | 27,095 | | | |
| 33 | 31 | 26 | | 22,850 | | | | 26,360 | | 27,495 | | | |
| 34 | 32 | 27 | | 23,170 | | | | 26,760 | | 27,895 | | | |
| 35 | 33 | 28 | | 23,490 | | | | 27,160 | | 28,295 | | | |
| 36 | 34 | 29 | | 23,810 | | | | 27,560 | | 28,695 | | | |
| 37 | 35 | 30 | | 24,130 | | | | 27,960 | | 29,095 | | | |

| Category | | Teachers / Principals | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | | TS 1-2006 | | TS 2-2006 | | | | | TS 3-2006 | | |
| Time scale | | Recruitment | | Recruitment | If not promoted to SLTS 2-II | If not promoted to SLTS 2-I | If not promoted to SLTS 1 | | Promotion | If not promoted to SLPS 2-II | If not promoted to SLPS 2-I |
| Number of Years | | 120 | | 150 | | | | | 210 | | |
| | | 10 | | 9 | | | | | 5 | | |
| | | 150 | | 210 | | | | | 300 | | |
| | | 5 | | 6 | | | | | 5 | | |
| | | | | 300 | | | | | 350 | | |
| | | | | 5 | | | | | 8 | | |
| | | | | 350 | | | | | 645 | | |
| | | | | 8 | | | | | 19 | | |
| | | | | 645 | | | | | | | |
| | | | | 12 | | | | Grade | | | |
| | Grade | SLTS 3-II | Grade | SLTS 3-I | | | | SLPS 3 | 15,350 | | |
| 1 | | 12,920 | SLTS 3-I | 13,790 | | | | | 15,560 | | |
| 2 | | 13,040 | | 13,940 | | | | | 15,770 | | |
| 3 | | 13,160 | | 14,090 | | | | | 15,980 | | |
| 4 | | 13,280 | | 14,240 | | | | | 16,190 | | |
| 5 | | 13,400 | | 14,390 | | | | | 16,400 | | |
| 6 | | 13,520 | | 14,540 | | | | | 16,700 | | |
| 7 | | 13,640 | | 14,690 | | | | | 17,000 | | |
| 8 | | 13,760 | | 14,840 | | | | | 17,300 | | |
| 9 | | 13,880 | | 14,990 | | | | | 17,600 | | |
| 10 | | 14,000 | | 15,140 | | | | SLPS 2-II | 17,900 | 17,900 | |
| 11 | | 14,120 | SLTS 2-II | 15,350 | 15,290 | | | | 18,250 | 18,200 | |
| 12 | | 14,270 | | 15,560 | 15,440 | | | | 18,600 | 18,500 | |
| 13 | | 14,420 | | 15,770 | 15,590 | | | | 18,950 | 18,800 | |
| 14 | | 14,570 | | 15,980 | 15,740 | | | | 19,300 | 19,100 | |
| 15 | | 14,720 | | 16,190 | 15,890 | | | | 19,650 | 19,400 | |
| 16 | | 14,870 | | 16,400 | 16,040 | | | | 20,000 | | |
| 17 | | | | 16,700 | | | | | 20,350 | | |
| 18 | | | | 17,000 | | | | | 20,700 | | |
| 19 | | | | 17,300 | | | | SLPS 2-I | 21,345 | | 21,050 |
| 20 | | | | 17,600 | | | | SLPS 1 | 21,990 | | 21,400 |
| 21 | | | SLTS 2-I | 17,900 | | 17,900 | | | 22,635 | | 21,750 |
| 22 | | | | 18,250 | | 18,200 | | | 23,280 | | 22,100 |
| 23 | | | | 18,600 | | 18,500 | | | 23,925 | | 22,450 |
| 24 | | | | 18,950 | | 18,800 | | | 24,570 | | 22,800 |
| 25 | | | | 19,300 | | 19,100 | | | 25,215 | | |
| 26 | | | | 19,650 | | 19,400 | | | 25,860 | | |
| 27 | | | | 20,000 | | | | | 26,505 | | |
| 28 | | | | 20,350 | | | | | 27,150 | | |
| 29 | | | | 20,700 | | | 21,050 | | 27,795 | | |
| 30 | | | SLTS 1 | 21,345 | | | 21,400 | | 28,440 | | |
| 31 | | | | 21,990 | | | 21,750 | | 29,085 | | |
| 32 | | | | 22,635 | | | 22,100 | | 29,730 | | |
| 33 | | | | 23,280 | | | 22,450 | | 30,375 | | |
| 34 | | | | 23,925 | | | 22,800 | | 31,020 | | |
| 35 | | | | 24,570 | | | | | 31,665 | | |
| 36 | | | | 25,215 | | | | | 32,310 | | |
| 37 | | | | 25,860 | | | | | 32,955 | | |
| 38 | | | | 26,505 | | | | | | | |
| 39 | | | | 27,150 | | | | | | | |
| 40 | | | | 27,795 | | | | | | | |
| 41 | | | | 28,440 | | | | | | | |

| Categary | | | | Executive | | | | Senior Executive | Special Posts at the level of Ministry Secretary |
|---|---|---|---|---|---|---|---|---|---|
| Salary Code | | | | SL 1-2006 | | | | SL 3-2006 | SL 4-2006 |
| Time scale for promotion & Increments | | | | Recruitment | If not promoted to II | If not promoted to I | | | |
| Number of Years | Average Performer | Exceptional Performer | | 645 | | | | 1,310 | 1,425 |
| | | | | 10 | | | | 12 | 12 |
| | | | | 790 | | | | | |
| | | | | 8 | | | | | |
| | | | | 1,050 | | | | | |
| | | | | 17 | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | Grade | | | | | | |
| 1 | 1 | 1 | III | 22,935 | | | | 42,390 | 47,515 |
| 2 | 2 | 2 | | 23,580 | | | | 43,700 | 48,940 |
| 3 | 3 | 3 | | 24,225 | | | | 45,010 | 50,365 |
| 4 | 4 | 4 | | 24,870 | | | | 46,320 | 51,790 |
| 5 | 5 | 5 | | 25,515 | | | | 47,630 | 53,215 |
| 6 | 6 | 6 | | 26,160 | | | | 48,940 | 54,640 |
| 7 | 7 | | | 26,805 | | | | 50,250 | 56,065 |
| 8 | 8 | | | 27,450 | | | | 51,560 | 57,490 |
| 9 | 9 | | | 28,095 | | | | 52,870 | 58,915 |
| 10 | 10 | | | 28,740 | | | | 54,180 | 60,340 |
| 11 | | | | 29,385 | | | | 55,490 | 61,765 |
| 12 | 11 | 7 | II | 30,175 | 30,030 | | | 56,800 | 63,190 |
| 13 | 12 | 8 | | 30,965 | 30,675 | | | 58,110 | 64,615 |
| 14 | 13 | 9 | | 31,755 | 31,320 | | | | |
| 15 | 14 | 10 | | 32,545 | 31,965 | | | | |
| 16 | 15 | 11 | | 33,335 | 32,610 | | | | |
| 17 | 16 | 12 | | 34,125 | 33,255 | | | | |
| 18 | 17 | 13 | | 34,915 | | | | | |
| 19 | | | | 35,705 | | | | | |
| 20 | 18 | 14 | I | 36,755 | | 36,495 | | | |
| 21 | 19 | 15 | | 37,805 | | 37,285 | | | |
| 22 | 20 | 16 | | 38,855 | | 38,075 | | | |
| 23 | 21 | 17 | | 39,905 | | 38,865 | | | |
| 24 | 22 | 18 | | 40,955 | | 39,655 | | | |
| 25 | 23 | 19 | | 42,005 | | | | | |
| 26 | 24 | 20 | | 43,055 | | | | | |
| 27 | 25 | 21 | | 44,105 | | | | | |
| 28 | 26 | 22 | | 45,155 | | | | | |
| 29 | 27 | 23 | | 46,205 | | | | | |
| 30 | 28 | 24 | | 47,255 | | | | | |
| 31 | 29 | 25 | | 48,305 | | | | | |
| 32 | 30 | 26 | | 49,355 | | | | | |
| 33 | 31 | 27 | | 50,405 | | | | | |
| 34 | 32 | 28 | | 51,455 | | | | | |
| 35 | 33 | 29 | | 52,505 | | | | | |
| 36 | 34 | 30 | | 53,555 | | | | | |

| Category | | Regulatory Services (Police & Similar Services) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Salary Code | | RS 1-2006 | | | RS 2-2006 | | |
| Time scale | | Recruitment | If not promoted to PS | | Recruitment & Promotion | If not promoted to IP | If not promoted to CIP |
| Number of Years | | 120 | | | 150 | | |
| | | 7 | | | 7 | | |
| | | 150 | | | 210 | | |
| | | 10 | | | 2 | | |
| | | 210 | | | 290 | | |
| | | 17 | | | 8 | | |
| | | | | | 325 | | |
| | | | | | 17 | | |
| | | | | | | | |
| 1 | PC/Gr.III | 13,880 | | SM / SI | 15,350 | | |
| 2 | | 14,000 | | | 15,500 | | |
| 3 | | 14,120 | | | 15,650 | | |
| 4 | | 14,240 | | | 15,800 | | |
| 5 | | 14,360 | | | 15,950 | | |
| 6 | | 14,480 | | | 16,100 | | |
| 7 | | 14,600 | | | 16,250 | | |
| 8 | | 14,720 | | | 16,400 | | |
| 9 | PS/Gr.II | 14,870 | 14,870 | | 16,610 | | |
| 10 | | 15,020 | 15,020 | | 16,820 | | |
| 11 | | 15,170 | 15,170 | IP | 17,110 | 17,110 | |
| 12 | | 15,320 | 15,320 | | 17,400 | 17,400 | |
| 13 | | 15,470 | 15,470 | | 17,690 | 17,690 | |
| 14 | | 15,620 | 15,620 | | 17,980 | 17,980 | |
| 15 | | 15,770 | 15,770 | | 18,270 | 18,270 | |
| 16 | | 15,920 | 15,920 | | 18,560 | 18,560 | |
| 17 | | 16,070 | 16,070 | | 18,850 | 18,850 | |
| 18 | | 16,220 | 16,220 | | 19,140 | 19,140 | |
| 19 | | 16,430 | 16,370 | CIP | 19,465 | 19,430 | 19,430 |
| 20 | | 16,640 | 16,520 | | 19,790 | 19,720 | 19,720 |
| 21 | | 16,850 | 16,670 | | 20,115 | 20,010 | 20,010 |
| 22 | | 17,060 | 16,820 | | 20,440 | 20,300 | 20,300 |
| 23 | | 17,270 | 16,970 | | 20,765 | 20,590 | 20,590 |
| 24 | | 17,480 | 17,120 | | 21,090 | 20,880 | 20,880 |
| 25 | | 17,690 | 17,270 | | 21,415 | 21,170 | 21,170 |
| 26 | | 17,900 | 17,420 | | 21,740 | 21,460 | 21,460 |
| 27 | | 18,110 | 17,570 | | 22,065 | 21,750 | 21,750 |
| 28 | | 18,320 | 17,720 | | 22,390 | 22,040 | 22,040 |
| 29 | | 18,530 | 17,870 | | 22,715 | 22,330 | 22,330 |
| 30 | | 18,740 | 18,020 | | 23,040 | 22,620 | 22,620 |
| 31 | | 18,950 | 18,170 | | 23,365 | 22,910 | 22,910 |
| 32 | | 19,160 | 18,320 | | 23,690 | 23,200 | 23,200 |
| 33 | | 19,370 | 18,470 | | 24,015 | 23,490 | 23,490 |
| 34 | | 19,580 | 18,620 | | 24,340 | 23,780 | 23,780 |
| 35 | | 19,790 | 18,770 | | 24,665 | 24,070 | 24,070 |

| Category | | Medical Officers | |
|---|---|---|---|
| Salary Code | | SL 2-2006 | |
| Time scale | | Recruitment | If not promoted to MO I |
| Number of Years | | 645 | |
| | | 4 | |
| | | 650 | |
| | | 8 | |
| | | 1,050 | |
| | | 16 | |
| | | | |
| | | | |
| | | | |
| 1 | Dentl | 25,515 | |
| 2 | Prilim | 26,160 | |
| 3 | | 26,805 | |
| 4 | | 27,450 | |
| 5 | MO II | 28,095 | |
| 6 | | 28,745 | |
| 7 | | 29,395 | |
| 8 | | 30,045 | |
| 9 | | 30,695 | |
| 10 | | 31,345 | |
| 11 | | 31,995 | |
| 12 | | 32,645 | |
| 13 | | 33,295 | |
| 14 | MO I | 34,345 | 33,945 |
| 15 | | 35,395 | 34,595 |
| 16 | | 36,445 | 35,645 |
| 17 | | 37,495 | 36,695 |
| 18 | | 38,545 | 37,745 |
| 19 | | 39,595 | |
| 20 | | 40,645 | |
| 21 | | 41,695 | |
| 22 | | 42,745 | |
| 23 | | 43,795 | |
| 24 | | 44,845 | |
| 25 | | 45,895 | |
| 26 | | 46,945 | |
| 27 | | 47,995 | |
| 28 | | 49,045 | |
| 29 | | 50,095 | |
| 30 | | | |
| 31 | | | |

| Category | Judicial Officers | | Law Officers | | | |
|---|---|---|---|---|---|---|
| Salary Code | Salary Code | SL 6-2006 | | Salary Code | SL 5-2006 | |
| Time scale | | | | | State coun. | If not promoted to SSC/SASA |
| Number of Years | | 645 | | | 645 | |
| | | 5 | | | 5 | |
| | | 790 | | | 790 | |
| | | 10 | | | 5 | |
| | | 1,050 | | | 1,050 | |
| | | 13 | | | 15 | |
| | | 1,310 | | | 1,310 | |
| | | 5 | | | 5 | |
| | | | | | | |
| 1 | Class II Gr II | 28,740 | SC/ ASA /ALD /Asst. Legal CIBC | | 28,095 | |
| 2 | | 29,385 | | | 28,740 | |
| 3 | | 30,030 | | | 29,385 | |
| 4 | | 30,675 | | | 30,030 | |
| 5 | | 31,320 | | | 30,675 | |
| 6 | | 31,965 | | | 31,320 | |
| 7 | | 32,755 | | | 32,110 | |
| 8 | President LT II | 33,545 | | | 32,900 | |
| 9 | Class II Gr I | 34,335 | | | 33,690 | |
| 10 | Dy.C.WC | 35,125 | | | 34,480 | |
| 11 | | 35,915 | | | 35,270 | |
| 12 | | 36,705 | SSC /SASA/SALD/ADG CIBC | | 36,320 | 36,060 |
| 13 | | 37,495 | | | 37,370 | 36,850 |
| 14 | | 38,285 | | | 38,420 | 37,640 |
| 15 | | 39,075 | | | 39,470 | 38,430 |
| 16 | Class I Gr II | 39,865 | | | 40,520 | 39,220 |
| 17 | | 40,915 | | | 41,570 | 40,010 |
| 18 | | 41,965 | | | 42,620 | |
| 19 | | 43,015 | | | 43,670 | |
| 20 | | 44,065 | SA / DSG/DLD/DDGCIBC | | 44,720 | |
| 21 | President LT I | 45,115 | | | 45,770 | |
| 22 | Class Gr I | 46,165 | | | 46,820 | |
| 23 | Com. WC | 47,215 | | | 47,870 | |
| 24 | | 48,265 | | | 48,920 | |
| 25 | President LT Spl | 49,315 | | | 49,970 | |
| 26 | Spl.Grade | 50,365 | | | 51,020 | |
| 27 | | 51,415 | | | | |
| 28 | | 52,465 | Addl. SG/LD | SL 7-2006 | 51,665 | |
| 29 | | 53,515 | | | 52,975 | |
| | | | | | 54,285 | |
| | SL 8-2006 | 54,285 | | | 55,595 | |
| | | 55,595 | | | 56,905 | |
| | | 56,905 | | | 58,215 | |
| | | 58,215 | | | | |
| | | 59,525 | | | | |
| | | 60,835 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | Fixed | | | |
| Appeal CJ | SF 1-2006 | 63,500 | SG | SF 1-2006 | 63,500 |
| | | Fixed | | | Fixed |
| President CA | | | | | |
| SCJ | SF 2-2006 | 65,000 | | | |
| | | Fixed | AG | SF 3-2006 | 67,000 |
| Chief J | SF 4-2006 | 70,000 | | | Fixed |
| | | Fixed | | | |

A

# ඇමුණුම II

## තනතුරු / සේවා ප්‍රතිවර්ගීකරණය, නැවත කාණ්ඩ ගත කිරීම සහ උසස්වීම් ක්‍රියා පරිපාටිය

### 1. ප්‍රතිවර්ගීකරණය

පහත සඳහන් සාධකයන් මත සේවකයින් වර්ගීකරණය කිරීම සුසංවිධානය කරනු ලැබ ඇත.

(අ) බඳවාගැනීමේ සුදුසුකම් / බඳවාගැනීමේ පරිපාටි

(ආ) උසස් කිරීමේ පරිපාටි

(ඇ) රාජකාරි ස්වභාවය

(ඈ) සරලභාවය

(ඉ) ප්‍රායෝගිකතාව

(ඊ) සමානුකූලතාව / සුසංයෝජනය

ඒ අනුව නව හැඳින්වීම් යොදා ගනිමින් තනතුරු/නිලතල පහත සඳහන් පරිදි යළි කාණ්ඩගත කරනු ලැබ ඇත.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාථමික මට්ටම | - | ශිල්පීය නොවන |
| 02. | ප්‍රාථමික මට්ටම | - | අර්ධ ශිල්පීය |
| 03. | ප්‍රාථමික මට්ටම | - | ශිල්පීය |
| 04. | කළමනාකරණ සහකාරවරුන් | - | තාක්ෂණික නොවන |
| 05. | කළමනාකරණ සහකාරවරුන් | - | තාක්ෂණික |
| 06. | ආශ්‍රිත නිලධාරී | | |
| 07. | ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන් | | |
| 08. | අධි පංක්තියේ කළමනාකරණ සහකාරවරුන් | | |
| 09. | විධායකයින් | | |
| 10. | ජ්‍යෙෂ්ඨ විධායකයින් | | |

11. පොලිස් සේවය හා අනිකුත් නියාමන සේවාවන්
12. අධිකරණ / නීති නිලධාරීන්
13. ගුරුවරුන් / විදුහල්පතිවරුන්
14. හෙද සේවය, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීය සේවාවන් / අතුරු වෛද්‍ය සේවාවන්
15. වෛද්‍ය වෘත්තිකයින්
16. වෛද්‍ය නිලධාරීන්

වර්ගීකරණයෙහි සහ නියමිත සුදුසුකම්වල සාරාංශයක් උපලේඛණය 1 හි දක්වේ.

## 2. සේවා මට්ටම්

### 1. ප්‍රාථමික මට්ටම

ප්‍රාථමික මට්ටම - ශිල්පීය නොවන
ප්‍රාථමික මට්ටම - අර්ධ ශිල්පීය
ප්‍රාථමික මට්ටම - ශිල්පීය

### 2. ද්විතීය මට්ටම

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන
කළමනාකරණ සහකාර - තාක්ෂණික
ආශ්‍රිත නිලධාරීන්
ශ්‍රී ලංකා ගුරු සේවය
පොලිස් කොස්තාපල් / සැරයන් /
ප්‍රධාන සැරයන් / උප පොලිස් පරීක්ෂක සහ අනිකුත් නියාමන සේවාවන්හි සමාන තනතුරු
අධීක්ෂණ කළමනාකරණ සහකාරවරුන්
හෙද සේවය / වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවාව, අතුරු වෛද්‍ය සේවා යන සේවා ගණයන්හි විශේෂ ශ්‍රේණිය හැර අනෙකුත් ශ්‍රේණි/ පන්ති

### 3. තෘතීය මට්ටම

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන්
අධි ශ්‍රේණියේ කළමනාකරණ සහකාරවරුන්
ශ්‍රී ලංකා විදුහල්පති සේවය
පොලිස් පරීක්ෂක / ප්‍රධාන පොලිස් පරීක්ෂක, අනිකුත් නියාමන සේවාවන්හි සමාන තනතුරු
හෙද සේවය, වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවය අතුරු වෛද්‍ය සේවය යන සේවාවන්හි විශේෂ ශ්‍රේණි / පන්තිය
වෛද්‍ය වෘත්තික

### 4. ජ්‍යෙෂ්ඨ මට්ටම

විධායකයින් / ජ්‍යෙෂ්ඨ විධායකයින්
අධිකරණ / නීති නිලධාරීන්
වෛද්‍ය නිලධාරීන්

## 3. නිර්වචනයන්

### 3.1 ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය, ශිල්පීය)

රජයේ ආයතනයන්හි කාර්ය කටයුතු ක්‍රියාත්මක කිරීම පහසු වන පරිදි අවශ්‍ය වන මූලික කාර්යයන් ඉටු කරන ප්‍රාථමික මට්ටමේ සේවක පිරිස " **ප්‍රාථමික මට්ටම** " යන පුළුල් සේවක ගණයට ඇතුළත් කෙරෙති. මෙහෙයුම් කාරක / පරිපාලක / විධායක ශ්‍රේණිවලට සිය කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පවිත්‍රකරණය, ආලෝකකරණය, ප්‍රවාහනය, සංදේශන පද්ධති ක්‍රියාත්මක කිරීම වැනි කාර්යයන් ඉටු කරණ පිරිස මෙම සේවක ගණය යටතේ වෙන්කර දක්වනු ලැබේ. මෙම

ගණය ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය යන උප ගණයන් තුනක් යටතට නැවත බෙදනු ලැබේ.

### 3.1.1 ශිල්පීය නොවන

තම රාජකාරි ඉටු කිරීම සඳහා කිසිම ස්වභාවයක කාර්මික පුහුණුවක් හෝ ශිල්පීය නිපුණතාවක් තිබිය යුතු යැයි බඳවා ගැනීමේ දී අපේක්ෂා කරනු නොලබන්නා වූ ද උසස් කිරීමේ කාර්යයන් සඳහා ජ්‍යෝෂ්ඨත්වය / පළපුරුද්ද පමණක් ම මිස ශිල්පීය නිපුණතා කිසිවක් සැලකිල්ලට ගනු නොලබන්නා වූ ද සේවක පිරිස මෙම ගණය යටතට ගැනේ. වර්තමානයෙහි මෙම ගණයට බඳවාගැනීම සඳහා අවම මූලික අධ්‍යාපන සුදුසුකම් වනුයේ 8 වැනි පංතිය / ශ්‍රේණිය හෝ 9 වසර සමත්ව තිබීමය.

### 3.1.2 අර්ධ ශිල්පීය

ඉහත ශිල්පීය නොවන ගණයට අදාළ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ප්‍රායෝගික පරීක්ෂණයක දී ඔප්පු කරනු ලබන කිසියම් නිශ්චිත ස්වභාවයක දක්ෂතා / ශිල්පීය නිපුණතා / කාර්මික පුහුණුව ලබා තිබිය යුතු යැයි නියම කරනු ලබන නමුත් ඒ සඳහා අදාළ බලයලත් ආයතනයකින් පිරිනැමුන නියමිත සහතිකයක් ලබා නොමැති සේවකයින් මෙකී අර්ධ ශිල්පීය සේවක ගණය යටතේ ලැයිස්තුගත කොට දක්වනු ලැබේ. මෙම සේවකයින් කිසියම් උසස් කිරීමේ පරිපාටියක් යටතේ අවශ්‍ය යැයි නියම කරනු ලැබ ඇති සුදුසුකම් අත්කර ගත් විට ශිල්පීය ගණයට උසස් කරනු ලැබිය හැකිය.

### 3.1.3 ශිල්පීය

ඉහත දක්වන ලද අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව සේවා ප්‍රවිෂ්ඨ සුදුසුකමක් ලෙස බලයලත් ආයතනයක් හෝ පුද්ගලයකු විසින් පිරිනැමෙන සහතිකයක් හෝ බලපත්‍රයක් ලබා ගැනීමට මඟ සැලසෙන දක්ෂතා / ශිල්පීය නිපුණතාව / කාර්මික පුහුණුව ලබා ඇති සේවකයින් මෙකී ශිල්පීය සේවක ගණය යටතේ දක්වනු ලැබේ.

## 3.2 කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන / තාක්ෂණික)

පරිපාලන, කළමනාකරණ සහ විධායක ශ්‍රේණිවලට සිය රාජකාරි ඉටු කිරීමෙහි ලා පහසුව හා සහාය සැලසීමේ කාර්යයන්හි නියුතු සේවක ගණයන් කළමනාකරණ සහකාර නම් වූ සේවක ගණයට ඇතුළත් වේ. ඔවුන්ගේ සේවා ප්‍රවිෂ්ඨ සුදුසුකම් ඔවුනට පැවරෙන රාජකාරි අනුව වෙනස් වේ. මෙම සේවක ගණය තවදුරටත් තාක්ෂණික නොවන සහ තාක්ෂණික වශයෙන් උප ගණයන් දෙකකට බෙදනු ලැබේ.

අධීක්ෂණ කාර්යයන් භාරව සිටින කළමනාකරණ සහකාරවරුන් "අධීක්ෂණ කළමනාකරණ සහකාරවරුන්" යන වෙනම ගණයක් යටතට පත් කෙරේ.

### 3.2.1 කළමනාකරණ සහකාරවරුන් – තාක්ෂණික නොවන

තුදෙක්ම අධ්‍යාපන සුදුසුකම් මත පමණක්ම බඳවා ගනු ලබන්නා වූ ද බඳවාගැනීම හෝ උසස් කිරීම සඳහා තාක්ෂණික පුහුණුවක් / නිපුණතාවක් තිබිය යුතු යැයි නියම කරනු නොලබන්නා වූ ද කළමනාකරණ සහකාරවරුන් තාක්ෂණික නොවන කළමනාකරණ සහකාරවරුන් ලෙස ලැයිස්තුගත කර දක්වනු ලැබේ. මෙම ගණය තවදුරටත් බණ්ඩ 2 කට බෙද දක්වනු ලැබේ.

#### 3.2.1.1 1 බණ්ඩය

බඳවාගැනීමේ දී අ.පො.ස. (උ.පෙ.) හෝ අ.පො.ස. (සා.පෙ.) සමත්ව තිබීම මූලික අධ්‍යාපන සුදුසුකම් වන්නා වූ ද ඉහත කී අධ්‍යාපන සුදුසුකමට අමතරව කිසියම් නිශ්චිත නිපුණතාවයන්/දක්ෂතාවයන් ලබා තිබිය යුතු වන්නා වූ ද බහුකාර්යයන් පවරනු ලැබ ඇත්තා වූ ද සේවකයින් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 1 බණ්ඩය යටතේ ලැයිස්තුගත කොට දක්වා ඇත.

දෙපාර්තමේන්තු ගත තනතුරු වන ලිපිකරු, යතුරු ලේඛක, ලඝු ලේඛක, ගබඩා භාරකරු, මුදල් අයකැමි (සරප්) සහ පොත් තබන්නා යන තනතුරු දරන්නන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය වැනි බහුකාර්ය සේවාවක් වශයෙන් ඔවුන්ගේ සේවය ප්‍රතිසංවිධානය කෙරෙන නව සේවාවක් මාස 03 ක් ඇතුළත පිහිටුවීමෙන් පසුව මෙම සේවා ගණයට අන්තර්ග්‍රහණය කළ යුතු වේ. අදාළ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් මේ සඳහා නව බඳවාගැනීමේ පරිපාටියක්, අදාළ සියලුම සේවකයින් නිශ්චිත කාල සීමාවක් තුළ බහුවිධ කුසලතාවන් අත් කර ගත යුතුය යන කොන්දේසිය ද ඇතුළත් කොට, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවාවේ බඳවාගැනීම් පරිපාටියට සමාන වන ලෙස සකස් කොට, ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් පරිදි යෝජිත සේවාව ස්ථාපනය කිරීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ ප්‍රකාර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාළ වැටුප් 2006.01.01 න් ක්‍රියාත්මක වන පරිදි ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත.

### 3.2.1.2 2 බණ්ඩය

ඉහත "කළමනාකරණ සහකාර" යන නිර්වචනයට ඇතුළත් වන්නා වූ ද, බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව අ.පො.ස. (සා.පෙ.) හෝ (උ.පෙ.) විභාගයෙන් සමත්ව තිබීම බඳවාගැනීමේ දී මූලික අධ්‍යාපන සුදුසුකම් වන්නා වූ ද සේවකයින් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 2 බණ්ඩය යටතේ ඇතුළත් කර ඇත.

## 3.2.2 කළමනාකරණ සහකාරවරුන් – තාක්ෂණික

අ.පො.ස. (උ.පෙ.) හෝ (සා.පෙ.) සමත්ව තිබීමට අමතරව සහතික ප්‍රදානයකට හෝ ඩිප්ලෝමාවකට හිමිකම් සැලසෙන තාක්ෂණික ස්වභාවයේ ආයතනික/ සේවාස්ථ පුහුණුවක් ලබා තිබීම බඳවාගැනීම සඳහා මූලික සුදුසුකමක් වන්නා වූ ද ඉහත කළමනාකරණ සහකාර යන නිර්වචනය තුළට ගැනෙන්නා වූ ද සියලු සේවකයින් කළමනාකරණ සහකාර - තාක්ෂණික යන සේවක ගණයට ඇතුළත් කෙරෙති. මෙම තාක්ෂණික උප ගණය තවදුරටත් බණ්ඩ 4 කට බෙදනු ලැබේ.

### 3.2.2.1 1 බණ්ඩය

තාක්ෂණික / වෘත්තීය පුහුණුව මාස 24 ට වැඩි සේවකයින් මෙම බණ්ඩය යටතට ගැනේ.

### 3.2.2.2 2 බණ්ඩය

තාක්ෂණික / වෘත්තීය පුහුණුව මාස 13 සිට 24 දක්වා වන සේවකයින් මෙම බණ්ඩය යටතට ගැනේ.

### 3.2.2.3 3 බණ්ඩය

තාක්ෂණික / වෘත්තිය පුහුණුවේ කාලය මාස 12 දක්වා වන සේවකයින් මෙම 3 ඛණ්ඩය යටතට ගැනෙති.

3.2.2.4 4 ඛණ්ඩය

කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයට ඇතුළත් තනතුරු සඳහා පුහුණුව පිණිස බඳවා ගනු ලබන අයවළුන් මෙ ඛණ්ඩය යටතට ගැනේ.

3.3 අධීක්ෂණ කළමනාකරණ සහකාරවරුන් - (තාක්ෂණික නොවන-තාක්ෂණික)

අධීක්ෂණ කාර්යයන් පවරනු ලැබ ඇත්තා වූ සහ බඳවාගැනීමේ දී ඉහත සඳහන් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන / තාක්ෂණික යන සේවා ගණයනට අදළ බඳවාගැනීමේ සුදුසුකම් මත බඳවා ගැනෙන්නාවූ ද. කළමනාකරණ සහකාරවරුන් අධීක්ෂණ කළමනාකරණ සහකාරවරුන් වශයෙන් නිල නාමගත කර ඇත.

3.4 හෙද සේවය, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තිය සේවාවන්, අතුරු වෛද්‍ය සේවාවන්

සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි හෙද සේවය, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තිය සේවාවන් සහ අතුරු වෛද්‍ය සේවාවන් මෙම සේවක කාණ්ඩය යටතේ පහත සඳහන් පරිදි කාණ්ඩගත කෙරේ.

3.4.1 විශේෂ ශ්‍රේණිය

හෙද සේවයෙහි සහ පහත සඳහන් සේවා ඛණ්ඩ 3 හි විශේෂ ශ්‍රේණියේ නිලධාරින් මෙම ශ්‍රේණියට අයත් වන අතර, ඔවුන් අතුරින් එක් එක් ඛණ්ඩයට අයත් ආරම්භක හා උපරිම පියවරයන් මෙම ශ්‍රේණියට අයත් වැටුප් පරිමාණය තුළ වෙන වෙනම දක්වා තිබේ.

3.4.2 හෙද සේවය :

විශේෂ ශ්‍රේණිය හැර හෙද සේවයට අයත් අතිකුත් සියලුම නිලධාරින්.

3.4.3 1 ඛණ්ඩය

පාසල් දන්ත චිකිත්සක, දන්ත කාර්මික ශිල්පී, කීටවිද්‍යා සහකාර, අක්ෂි විද්‍යා සහායක, විකිරණ ශිල්පී, ඖෂධවේදී, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, භෞත චිකිත්සක, වෘත්තිය චිකිත්සක. (විශේෂ ශ්‍රේණිය හැර)

3.4.4 2 ඛණ්ඩය

මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි. (විශේෂ ශ්‍රේණිය හැර)

3.4.5 3 ඛණ්ඩය

විද්‍යුත්තන්තු රේඛණ සටහන්කරු, විද්‍යුත් විකර්පණ සටහන්කරු, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී. (විශේෂ ශ්‍රේණිය හැර)

3.5 වෛද්‍ය වෘත්තිකයන්

සියලුම වෛද්‍ය වෘත්තිකයින් (සහකාර වෛද්‍ය වෘත්තිකයින්, ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයින්) I, II සහ විශේෂ යනුවෙන් ශ්‍රේණි තුනකින් සමන්විත මෙම වෛද්‍ය වෘත්තික ගණය යටතේ ලැයිස්තුගත කර ඇත.

3.6 ආශ්‍රිත නිලධාරීන්

බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව මූලික අධ්‍යාපන සුදුසුකම උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් වන්නා වූ ද මින්මතු මෙහි පහත සඳහන් අනිකුත් සියලුම සේවාවනට ඇතුලත් නොවන්නා වූද තනතුරු සඳහා බඳවා ගන්නා ලද සේවකයින් මේ යටතේ ගැනේ.

3.7 ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන්

මෙම සේවක ගණය ද පහත සඳහන් පරිදි ඛණ්ඩ දෙකකට (02) බෙදනු ලැබේ.

3.7.1 1 ඛණ්ඩය

පශ්චාත් උපාධි සුදුසුකම් සහිත උපාධි සුදුසුකම් ලබා ඇති සේවකයින් හෝ උපාධි සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබ නිශ්චිත ස්වභාවයේ නිපුණතා අත් කර ගෙන ඇති හෝ අත් කර ගත යුතු යැයි අපේක්ෂිත දීපව්‍යාප්ත සේවාවනට ඇතුලත් නොවන භාෂා පරිවර්තකයින් වැනි සේවකයින් මෙම ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී 1 ඛණ්ඩය යටතට පත් කර ඇත.

3.7.2 2 ඛණ්ඩය

පහත සඳහන් ආකාරයට බඳවාගැනිම සඳහා තෝරාගනු ලැබූ සහ ව්‍යවස්ථාවකින්/ පනතකින් / ආඥා පනතකින් තමන් වෙත පැවරෙන පරිපාලනමය / බලාත්මක කිරීමේ ස්වභාවයේ රාජකාරි ඉටු කරන දීපව්‍යාප්ත සේවාවලට අයත් නොවන නිලධාරීන්ගෙන් මෙම ක්ෂේත්‍රගත/කාර්යාලගත සේවකයින්ගේ 2 ඛණ්ඩය සමන්විත වේ.

(අ) බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව මූලික සුදුසුකම් උපාධියක් හෝ සමාන සුදුසුකමක් වන්නා වූ සහ බඳවාගැනීම සඳහා වන විභාගයක් මගින් තෝරාගනු ලැබූ නිලධාරීන්

(ආ) නිශ්චිත තනතුරුවල නිශ්චිත සේවා කාලයක් සපුරා ඇති සේවකයින් සඳහා පමණක්ම පැවැත්වෙන විභාගයක් මගින් බඳවාගැනීම සඳහා තෝරාගනු ලැබූ නිලධාරීන්.

3.8 අධි මට්ටමේ කළමනාකරණ සහකාරවරුන්

මේ වූ කලී කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික ගණයේ සේවකයින් සඳහා උසස්වීමේ ශ්‍රේණියකි.

3.9 ගුරුවරුන් / විදුහල්පතිවරුන්

ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සියලුම සාමාජිකයින් මෙම ගණය යටතේ වෙන වෙනම ලැයිස්තුගත කර ඇත.

3.10 විධායකයින්

දිපව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් සහ උපාධි සුදුසුකම් මත හෝ කළමනාකරණ තනතුරක නියමිත සේවා කාලයක් සම්පූර්ණ කර තිබීමේ සුදුසුකම මත බඳවා ගනු ලබන විධායක කාර්යයන් ඉටු කරණ නිලධාරීන් මේ යටතේ වර්ග කරනු ලැබේ.

3.11 ජ්‍යෙෂ්ඨ විධායකයින්

දිප ව්‍යාප්ත සේවයක 1 වැනි පන්තියේ තනතුරක හෝ ඒ හා සමාන තනතුරක අවම වශයෙන් 5 වසරක සේවය සහිතව එම සේවාවන්හි වසර 18 ක සේවයක් සපුරා ඇත්තාවූ නිලධාරීන් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිශ්චිතව දක්වා ඇති කිසියම් වෘත්තියක නිශ්චිත සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වෘත්තිකයින් ද මෙම ජ්‍යෙෂ්ඨ විධායක ගණය යටතේ ලැයිස්තු ගත කර ඇත.

3.12 අමාත්‍යාංශ ලේකම් මට්ටමේ විශේෂ තනතුරු

අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ඒ හා සමාන තත්ත්වයේ බලතල ක්‍රියාත්මක කරන අනෙකුත් නිලධාරීන් මේ ආකාරයෙන් වර්ග කරනු ලැබ ඇත.

3.13 පොලිස් සේවය සහ අනිකුත් නියාමන සේවාවන්

කොස්තාපල් නිලයේ සිට ප්‍රධාන පරීක්ෂක දක්වා වන පොලිස් නිලධාරීන් **"පොලිස් සේවය"** යන නාමය යටතේ ලැයිස්තු ගත කර ඇත.

ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයන්හි පොලිස් සේවයෙහි තනතුරුවලට සමාන තනතුරු දරන නිලධාරීන් **"අනිකුත් නියාමන සේවා"** යන ගණයට ඇතුළත් කෙරේ.

සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ඉහළ මට්ටමේ තනතුරු **"විධායක/ජ්‍යෙෂ්ඨ විධායක"** ගණ යටතේ දක්වා ඇත.

3.14 වෛද්‍ය නිලධාරීන්

**"වෛද්‍ය නිලධාරීන්"** වශයෙන් නම් කරනු ලැබ ඇති ගණය වෛද්‍ය නිලධාරීන් ලෙස දැනට නිල නාමගත කර ඇති නිලධාරී ශ්‍රේණිවලින් සමන්විත වේ. එහෙත්, වෛද්‍ය පරිපාලකයින්ගේ සහ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ/විශේෂඥ දන්ත

ශල්‍ය වෛද්‍යවරුන්ගේ වැටුප් පරිමාණයන් ඇතුළත් කරනු ලබන්නේ විධායක සහ ජ්‍යෙෂ්ඨ විධායක ගණයන් යටතේ ය.

### 3.15 අධිකරණ

මෙම ගණයට අයත් වනුයේ ප්‍රාථමික අධිකරණ විනිසුරුවරුන්, මහෙස්ත්‍රාත්වරුන්, දිසා විනිසුරුවරුන්, මහාධිකරණ විනිසුරුවරුන්, අභියාචනාධිකරණ විනිසුරුවරුන්, අභියාචනාධිකරණ සභාපති, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්, අගවිනිසුරු

සහ

කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සහ කම්කරු වන්දි කොමසාරිස්වරුන් වෙති.

### 3.16 නීති නිලධාරී

නීතිපති, සොලිසිටර් ජනරාල්වරුන්, නීති කෙටුම්පත් සම්පාදක, රාජ්‍ය නීතිඥ, රජයේ අධිනීතිඥ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ ජනරාල් සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් මෙම ගණය සමන්විත වේ. කිසියම් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක සේවක සංඛ්‍යාව තුළ නීති නිලධාරී යනුවෙන් නිල නාමගත කරනු ලැබ ඇති කිසියම් නිලධාරියෙක් මෙහි ඇතුළත් කරනු ලැබ නොමැත. ඔවුන් අදාළ ඒ ඒ සේවක සංඛ්‍යාවන් තුළ **"විධායක"** ගණය යටතේ ඇතුළත් කෙරේ.

## 4. උසස් කිරීමේ පටිපාටිය

4.1.1 නව වැටුප් ව්‍යුහය සකසනු ලැබ ඇත්තේ දැනට පවත්නා ක්‍රමයන්ට වඩා වෙනත් උසස් කිරීමේ ක්‍රමයක් සඳහා ඉඩ සලසමිනි.

4.1.2 කාර්යසාධනය පදනම් කර ගත් ක්‍රමයක් නිර්දේශ කරනු ලබන අතර, මෙම නියමයනට අනුකූලව නව උසස්වීම් ක්‍රමයන් සකසා හඳුන්වා දීමත් සමග උසස්වීම් ලබා දීමේ වර්තමාන පරිචය අවසන් කළ යුතුය.

4.1.3 වාර්ෂික කාර්යසාධනය ඇගයීමෙහි දී කිසියම් සේවකයකුගේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා පහළ යැයි නිගමනය කරනු ලැබුවහොත් වැටුප් වර්ධක හෝ උසස්වීම් ලැබීමට ඔහු සුදුසුකම් නොලබනු ඇත. අන්තර්ග්‍රහණය ක්‍රියාවලියෙහි දී හුදෙක්ම අතුරුපූරණ පියවරක් ලෙස යම් ශ්‍රේණියකට අදාළ උපරිම වැටුප් පියවරට වඩා ඉහළ වැටුපක් දැනටමත් ලබන සේවකයින්ගේ වැටුප් වර්ධක ඔවුන්ට පෞද්ගලික වන සේ වර්තමාන මට්ටමෙහි අවුරා තබනු ලැබේ. එතෙකුදු වුවත්, ඉහත සඳහන් පරිදි අදාළ ශ්‍රේණියට නියමිත උපරිම පියවරට වඩා පහළ වැටුපක් වර්තමානයෙහි ලබමින් සිටින සේවකයින්ට හෝ නව ප්‍රවේශයකයින්ට මෙම සහනය අත් නොවේ.

4.1.4 උසස්වීම් ශ්‍රේණිවල සේවක සංඛ්‍යාව සැලකිය යුතු තරම් අල්ප වීම හේතුවෙන් උසස්වීම් අවස්ථා අතිශයින් සීමිත සේවාවන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඒකාබද්ධ තීරණයක් මත ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද විමසා මෙම නියමයෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

4.1.5 කාර්යසාධනය නියමිත මට්ටමට වඩා පහළ යැයි නිගමනය කරනු ලබන සේවකයින්ගේ වැටුප් වර්ධක එසේ පෙනී ගිය විට අත්හිටුවනු ලබන අතර, ඒවා නැවත ලබා දෙන්නේ ඔවුන්ගේ කාර්යසාධනය සතුටුදායක බව පෙනී ගියහොත් ඒ අවස්ථාවේ දී පමණි.

## 4.2 නව උසස්වීම් පරිපාටිය

උසස්වීම් ලබා දෙනු පිණිස යෝග්‍ය වන සේවකයින් සඳහා ආකාර දෙකකින් (2) සමන්විත පහත සඳහන් උසස්වීම් පරිපාටියක් යෝජනා කරනු ලැබේ. කෙසේ වෙතත්, සියලුම සේවකයන් උසස්වීම් ලැබීම සඳහා අදාළ බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් නුසුදුස්සෙක් නොවන්නේ නම් පමණක් මෙම උසස්වීම් ක්‍රමය අදාළ කර ගත යුතුය.

### 4.2.1 සුවිශේෂී කාර්යසාධනය සහිත සේවකයින් සඳහා කඩිනම් උසස්වීම්

කාර්ය සාධන ඇගයීමේදී සිය කාර්යසාධනය සුවිශේෂී වන බවට නිගමනය කරනු ලබන සේවකයින් බඳවා ගනු ලැබීමෙන් පසු එළඹෙන 6 වැනි වසර අවසානයේ දී පහත සඳහන් තෝරා ගැනීමේ ක්‍රියාවලියට මුහුණ දී ඒවායේ ප්‍රතිඵල මත සිය ප්‍රථම උසස්වීම උපයා ගැනීමට හිමිකම් ලබනු ඇත.

(අ) තත් කාර්යය සඳහා පවත්වනු ලබන තරඟ විභාගයක් හෝ ඒ හා සමාන තෝරා ගැනීමේ ක්‍රියාවලියක්

(ආ) උචිත මට්ටමක විනිවිද භාවයක් සහිත ව්‍යුහගත සහ පරමාර්ථ පාදක ඇගයීම් පටිපාටියක් මගින් නිගමනය කරන ලද කාර්යසාධන ඇගයීම

කඩිනම් මග ඔස්සේ තම ප්‍රථම උසස්වීම උපයා ගන්නා මෙම ගණයේ උසස්වීම්ලාභීන් මේ අවස්ථාවේ අතිරේක වැටුප් වර්ධක පහක වාසිය උපයා ගනිති. මෙයින් අදහස් වනුයේ අදාළ සේවයට නියමිත වැටුප් පරිමාණය ඇතුළත උසස්වීම් ශ්‍රේණියට අදාළ ස්ථරයෙහි ආරම්භක වැටුප් පියවරෙහි සේවකයා පිහිටුවනු ලබන බවය. මෙම මාර්ගය ඔස්සේ උසස් කරනු ලබන සේවකයින් නියමිත කාලපරිච්ඡේදයන් අවසන දී ඊළඟ උසස්වීම්වලට හිමිකම් ලබනු ඇත.

### 4.2.2 සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය – උසස්වීම් මග

ඉහත සඳහන් ඇගයීම් ක්‍රියාවලියෙහි දී කාර්යසාධන මට්ටම සාමාන්‍ය යැයි නිගමනය කරනු ලබන සේවකයින් උසස් කරනු ලබන්නේ බඳවා ගනු ලැබීමෙන් පසු 10 වැනි වසර අවසානයේ දී ය. ඔවුනට එක් වැටුප් වර්ධකයක වාසිය අත්වනු ඇත. මෙම ගණයේ සේවකයින්ගේ ඉන්පසුව වන උසස්වීම් සඳහා **කඩිනම් මග** සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇති ආකාරයට ම නියමිත කාලපරිච්ඡේදයන් අවසන දී හිමිකම් ලබනු ඇත.

4.3 සියලුම සේවක ගණයන් සඳහා පරමාර්ථ පූර්ණ, අර්ථවත්, සඵලදායී සහ විනිවිද භාවය සහිත කාර්යසාධනය ඇගයීමේ ක්‍රමයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කරනු ලැබේ.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම උදෙසා පවත්නා සේවා ව්‍යවස්ථා සංශෝධනය කිරීම සහ සේවා ව්‍යවස්ථා නොමැති සේවාවන් සඳහා අලුතින් ව්‍යවස්ථා සම්පාදනය කිරීම අවශ්‍ය විය හැක.ඒ අනුව යථෝක්ත උසස්වීම් ක්‍රමයන්ට අනුගත වන

පරිද්දෙන් උසස්වීම්වලට අදාලව සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පරිපාටි සංශෝධනය කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් සහ දෙපාර්තමේන්තු සහ අනිකුත් රජයේ ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 7/2003 මෙයින් අහෝසි කරනු ලැබේ. ඒ අනුව එක් එක් ශ්‍රේණියට අදල වැටුප් පරිමාණයෙහි උපරිම තලය ඇමුණුම 1 හි දක්වා ඇත. ස්ථාවර වැටුප් සඳහා අවකාශ සලසනු ලැබ ඇති ප්‍රතිශත වැඩි කිරීම් ද මෙයින් ඉවත් කරනු ලැබේ.

4.5 යෝජිත නව උසස්වීම් ක්‍රමය අනුව සේවකයින්ට ඊළඟ උසස්වීම උපයා ගැනීම සඳහා සේවය කළ යුතු නිශ්චිත වසර ගණනක් නියම කොට දක්වනු ලැබේ. මෙම ක්‍රියාවලිය තුළ දී ඔවුන් උසස් කරනු ලබන ශ්‍රේණියෙහි වැටුප් පරිමාණයෙහි මැද පියවරක නැතිමට සිදුවන අවස්ථා තිබිය හැක. එවැනි සේවකයින්ට ඊළඟ උසස්වීම් උපයා ගැනීම සඳහා සේවය කිරීමට හිමිකම ඇති මුළු කාලපරිච්ඡේදයේම වාසිය ලබා ගැනීමට අවකාශ දිය යුතුය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වාර්ෂික වැටුප් වර්ධක උපයා ගැනීමට ද ඔවුනට හැකි විය යුතුය. මේ සඳහා **"උසස් කරනු නොලැබී නම්"** යන තීරුවෙහි අධි සංඛ්‍යාත වැටුප් පියවර මගින් ඉඩකඩ සලසනු ලැබ ඇත. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන සලසා ඇති පරිද්දෙන් සේවකයින් ඔවුන්ගේ නව ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලියෙහි දී ද මෙම පටිපාටියම අනුගමනය කළ යුතුය. මෙහි ප්‍රතිපාදනය කර ඇති අධි සංඛ්‍යාත වැටුප් පියවර වර්තමාන සේවකයින්ට සහන සැලසීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි අවස්ථා නිර්දේශයක් ලබා ගැනීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත අනිවාර්යයෙන්ම යොමු කළ යුතුය.

## උපලේඛනය 1

## සේවා ගණ සහ අවශ්‍ය අවම සුදුසුකම්

| | තනතුරේ තත්ත්වය | ශ්‍රේණිය | මූලික සුදුසුකම් |
|---|---|---|---|
| 01. | ප්‍රාථමික මට්ටම - ශිල්පීය නොවන | III, II, I, විශේෂ පන්තිය | 8 වන ශ්‍රේණිය/ 9 වසර |
| 02. | ප්‍රාථමික මට්ටම - අර්ධ ශිල්පීය | III, II, I, විශේෂ පන්තිය | 8 වන ශ්‍රේණිය/ 9 වසර සමග ප්‍රායෝගික පරීක්ෂණයක දී සනාථ කරනු ලබන නිශ්චිත ක්ෂේත්‍රයක පළපුරුද්ද |
| 03. | ප්‍රාථමික මට්ටම - ශිල්පීය සමග | III, II, I, විශේෂ පන්තිය | 8 වන ශ්‍රේණිය/ 9 වසර සහතික සහිත/බලපත්‍ර ලත් වෘත්තීය පුහුණුවක්/පළපුරුද්දක් හෝ සේවා කාලයක් |
| 04. | කළමනාකරණ සහකාර බණ්ඩ 2 | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ |
| 05. | කළමනාකරණ සහකාර බණ්ඩ 1 | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ සමග හැකියාවක් නියම කරනු ලබන ක්ෂේත්‍රයක |
| 06. | අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ/තාක්ෂණ නොවන) | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ. සමග අධීක්ෂණ රාජකාරි |
| 07. | කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ සමග මාස 12 දක්වා සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් පිරිනමනු ලබන පුහුණුවක් |
| 08. | එම බණ්ඩ 2 | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ සමග මාස 13 සිට 24 දක්වා සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් පිරිනමන ලබන පුහුණුවක් |
| 09. | එම බණ්ඩ 1 | III, II, I | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ සමග මාස 24 ට වැඩි සහතිකයක් හෝ ඩිප්ලෝමාවක් පිරිනමනු ලබන පුහුණුවක් |
| 10. | හෙද සේවය, වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවය හා අතුරු වෛද්‍ය සේවා | III, II, I | |

| | | | |
|---|---|---|---|
| අ. | අතුරු වෛද්‍ය සේවා 3 බණ්ඩය | | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ විද්‍යා + තාක්ෂණික/වෘත්තීය පුහුණුවක් |
| ආ. | අතුරු වෛද්‍ය සේවා 2 බණ්ඩය | | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ විද්‍යා + තාක්ෂණික/වෘත්තීය පුහුණුවක්. |
| ඇ. | අතුරු වෛද්‍ය සේවා 1 බණ්ඩය සහ වෛද්‍ය කර්මය සඳහා වන පරිපූරක වෘත්තීය සේවය | | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ විද්‍යා + තාක්ෂණික/වෘත්තීය පුහුණුවක්. |
| ඈ. | හෙද සේවය | | අ.පො.ස. සා.පෙළ/උ.පෙළ විද්‍යා + තාක්ෂණික/වෘත්තීය පුහුණුවක්. |
| ඉ. | විශේෂ ශ්‍රේණිය | තේරීම් ශ්‍රේණිය (විශේෂ) | උසස්වීම් ශ්‍රේණිය |
| 11. | ආශ්‍රිත නිලධාරීන් | III, II, I | උපාධිය හෝ සමාන සුදුසුකම් |
| 12. | ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 | III, II, I | උපාධියක් හෝ ඊට සමාන සුදුසුකම් හෝ නිශ්චිත තනතුරක/ ශ්‍රේණියක නිශ්චිත සේවා කාලයක් සහිතව ලිඛිත විභාගයක ප්‍රතිඵල මත |
| 13. | ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 1 | III, II, I | උපාධිය හෝ ඊට සමාන සුදුසුකම් සමග පශ්චාත් උපාධි සුදුසුකම් හෝ උපාධිය ද සමග නිශ්චිත කුශලතාවක් |
| 14. | කළමනාකරණ සහකාර අධි පංතිය | තේරීම් ශ්‍රේණිය | තේරීම් ශ්‍රේණියේ තනතුරක නිශ්චිත සේවා කාලයක් මත සිදු කෙරෙන උසස්වීමකි. |
| 15. | ලියාපදිංචි/සහකාර වෛද්‍ය වෘත්තිකයන් | III, I, විශේෂ ශ්‍රේණිය | බඳවාගැනීම් පරිපාටිය/ සේවා ව්‍යවස්ථාව අනුව |
| 16. | වෛද්‍ය නිලධාරීන් | II, I, විශේෂඥ | |
| | (අ) දන්ත ශල්‍ය වෛද්‍ය | | දන්ත වෛද්‍ය උපාධිය (බීඩීඑස්) |
| | (ආ) වෛද්‍ය නිලධාරීන් | | වෛද්‍ය උපාධිය (එම්බීබීඑස්) |
| | (ඇ) වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය | | වෛද්‍ය/දන්ත වෛද්‍ය උපාධිය සමග පශ්චාත් උපාධියක් |

| | | | |
|---|---|---|---|
| 17. | විධායක නිලධාරීන් | III, II, I<br>අතිරේක ලේකම්වරුන්/ ඒ සමාන නිලධාරීන් ලේකම්වරුන් | උපාධියක් හෝ සමාන සුදුසුකම් මත විවෘත තරග විභාගයකින් හෝ වසර 15 ක සේවා කාලයක සීමිත තරග විභාගයකින් බඳවා ගනු ලබන විධායක වගකීම් පැවරුණ නිලධාරීන් |
| 18. | ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | | විධායක ශ්‍රේණියක පළමු පන්තියේ තනතුරක වසර 05 ක් සමග වසර 18 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ වගකීම් පැවරුණ නිලධාරීන්/ නිශ්චය කරනු ලබන වෘත්තීන්හි නිශ්චිත කාල සීමාවක සේවය සහිත සාමාජිකයින්. |

19. අධිකරණ සේවය :

| | | |
|---|---|---|
| (අ) | අගවිනිසුරු | බඳවාගැනීම් පරිපාටිය/සේවා ව්‍යවස්ථා අනුව |
| (ආ) | ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු | |
| (ඇ) | අභියාචනාධිකරණ විනිසුරු | |
| (ඈ) | මහාධිකරණ විනිසුරු | |
| (ඉ) | අධිකුත් විනිසුරුවරුන් | |
| (ඊ) | කම්කරු විනිශ්චය සභාපතිවරුන් | |
| (උ) | කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කොමසාරිස්වරුන් | |

20. නීති නිලධාරීන්

| | | |
|---|---|---|
| (අ) | නීතිපති දෙපාර්තමේන්තුව | බඳවාගැනීම් පරිපාටිය/සේවා ව්‍යවස්ථා අනුව |
| (ආ) | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | |
| (ඇ) | අධිකරණ සේවා කොමිෂන් සභාව | |
| (ඈ) | නීති කොමිෂම | |
| (ඉ) | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | |

| | | | | |
|---|---|---|---|---|
| 21. | (අ) | ගුරු සේවය - | 3-II, 3-I<br>2-II, 2- I<br>I | සේවා ව්‍යවස්ථාව අනුව |
| | (ආ) | විදුහල්පති සේවය - | 3, 2-II<br>2-I, I | සේවා ව්‍යවස්ථාව අනුව |

ඇමුණුම இணைப்பு Annexure III

වැටුප් පරිවර්තන සූචිය சம்பள மீளமைப்பு அட்டவணை Index to Salary Conversion

| සේවාව/තනතුර | சேவை/பதவி | Service/Post | Salary Code |
|---|---|---|---|
| **අධිකරණ නිලධාරීන්** | **நீதி அலுவலர்கள்** | **Judicial Officers** | |
| අග්‍රවිනිශ්චයකාරවරයා | பிரதம நீதியரசர் | Chief Justice | SF 4-2006 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු<br>අභියාචනාධිකරණයේ සභාපතිවරයා | உச்ச நீதிமன்ற நீதிபதிகள்<br>மேன்முறையீட்டு நீதிமன்ற தலைவர் | Puisne Judges /<br>President Court of Appeal | SF 2-2006 |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු | மேன்முறையீட்டு நீதிமன்ற நீதிபதிகள் | Appeal Court Judges | SF 1-2006 |
| මහාධිකරණ විනිශ්චයකාරවරු | மேல் நீதிமன்ற நீதிபதிகள் | High Court Judges | SL 8-2006 |
| ශ්‍රී ලංකා අධිකරණ සේවය විශේෂ ශ්‍රේණිය I පන්තිය I ශ්‍රේණිය, I පන්තිය II ශ්‍රේණිය, II පන්තිය I ශ්‍රේණිය, II පන්තිය II ශ්‍රේණිය, | இலங்கை நீதிச் சேவை விசேட தரம்<br>வகுப்பு 1 தரம் 1, வகுப்பு 1 தரம் 11<br>வகுப்பு 11 தரம் 1, வகுப்பு 11 தரம் 11 | Sri Lanka Judicial Service<br>Spl Gr, Class I Gr I, Class I Gr II<br>Class II Gr I, Class II Gr II | SL 6-2006 |
| කම්කරු විනිශ්චය සභා සභාපති<br>විශේෂ ශ්‍රේණිය I ශ්‍රේණිය, II ශ්‍රේණිය,<br>කම්කරු වන්දි කොමසාරිස්<br>නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් | தொழில் நியாய சபை தலைவர் விசேட தரம், தரம் 1, தரம் 11<br>தொழில் இழப்பீட்டு ஆணையாளர்<br>பிரதி தொழில் இழப்பீட்டு ஆணையாளர் | President, Labour Tribunal<br>Spl. Grade, Gr. I, Gr.II<br>Commissioner for Workmen's Compensation<br>Deputy Commissioner for Workmen's Compensation | SL 6-205<br>SL 6-206<br>SL 6-206 |
| **නීති නිලධාරීන්** | **சட்ட அலுவலர்கள்** | **Law Officers** | |
| නීතිපති | சட்டத்துறை அதிபதி | Attorney General | SF 3-2006 |
| සොලිසිටර් ජනරාල් | மன்றாடி அதிபதி | Solicitor General | SF 1-2006 |
| අතිරේක සොලිසිටර් ජනරාල්/නීති කෙටුම්පත් සම්පාදක | மேலதிக மன்றாடி அதிபதி/<br>சட்ட வரைஞர் | Additional Solicitor General/<br>Legal Draftsman | SL 7-2006 |
| නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්/රාජ්‍ය නීතිඥ/ නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | பிரதி மன்றாடி அதிபதி/அரச சட்டத்தரணி/ பிரதி சட்ட வரைஞர் | Dy, Solicitor General / State Attorney /<br>Deputy Legal Draftsman | SL 5-2006 |
| ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ/ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ/ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | சிரேஸ்ட அரச சட்டவாதி/<br>சிரேஸ்ட உதவி அரச சட்டத்தரணி/<br>சிரேஸ்ட உதவி சட்டவரைஞர் | Senior State Counsel /<br>Senior Asst. State Attorney /<br>Senior Asst. Legal Draftsman | SL 5-2006 |
| රජයේ අධි නීතිඥ/සහකාර රාජ්‍ය නීතිඥ/සහකාර නීති කෙටුම්පත් සම්පාදක | அரச சட்டத்தரணி/உதவி அரச சட்டத்தரணி/சட்டவரைஞர் | State Counsel / Asst. State Attorney /<br>Asst. Legal Draftsman | SL 5-2006 |
| **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව** | **இலஞ்சம் அல்லது ஊழல் பற்றிய குற்றச்சாட்டுக்கள் புலனாய்வுக்குழு** | **Office Of the Commission to Investigate Allegations of Bribery or Corruption** | |
| අධ්‍යක්ෂ ජනරාල් | பணிப்பாளர் நாயகம் | Director General | SL 4-2006 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | பிரதிப் பணிப்பாளர் நாயகம் | Dy. Director General | SL 5-2006 |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | உதவிப் பணிப்பாளர் நாயகம் | Asst. Director General | SL 5-2006 |
| සහකාර අධ්‍යක්ෂ (නීති) | உதவிப் பணிப்பாளர் சட்டத்துறை | Asst. Director Legal | SL 5-2006 |

| | | | |
|---|---|---|---|
| අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් | நீதிச் சேவை ஆணைக்குழுவின் செயலாளர் | Secretary Judicial Service Commission | SL 8-2006 |
| රාජ්‍ය සේවය | அரச சேவை | **Public Service** | |
| ජනාධිපති ලේකම් | ஜனாதிபதியின் செயலாளர் | Secretary to the President | SL 4-2006 |
| අමාත්‍ය මණ්ඩල ලේකම් | அமைச்சரவைச் செயலாளர் | Secretary to Cabinet | SL 4-2006 |
| අමාත්‍යාංශ ලේකම්(කැබිනට්/කැබිනට් නොවන) | அமைச்சுச் செயலாளர்(அமைச்சரவை/அமைச்சரவையல்லாத) | Secretary to a Ministry (Cabinet/Non Cabinet) | SL 4-2006 |
| විගණකාධිපති | கணக்காய்வாளர் தலைமை அதிபதி | Auditor-General | SL 4-2006 |
| මැතිවරණ කොමසාරිස් | தேர்தல் ஆணையாளர் | Commissioner of Elections | SL 4-2006 |
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් | திறைசேரியின் பிரதிச் செயலாளர் | Deputy Secretary to the Treasury | SL 4-2006 |
| පලාත් සභාවක ප්‍රධාන ලේකම් | மாகாண சபை பிரதம செயலாளர் | Chief Secretary of a Provincial Council | SL 4-2006 |
| අමාත්‍යාංශයක අතිරේක ලේකම් | அமைச்சொன்றின் மேலதிக செயலாளர் | Additional Secretary to a Ministry | SL 3-2006 |
| පලාත් සභාවක ආණ්ඩුකාරවරයාගේ ලේකම් | மாகாண சபையொன்றின் ஆளுநரது செயலாளர் | Secretary to a Governor of a Provincial Council | SL 3-2006 |
| පලාත් සභාවක අමාත්‍යවරයෙකුගේ ලේකම් | மாகாண சபையொன்றின் அமைச்சரொருவரின் செயலாளர் | Secretary to a Minister of a Provincial Council | SL 3-2006 |
| දිස්ත්‍රික් ලේකම් | மாவட்ட செயலாளர் | District Secretary | SL 3-2006 |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | இலங்கை நிர்வாக சேவை | **Sri Lanka Administrative Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | இலங்கை பொறியியல் சேவை | **Sri Lanka Engineering Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | இலங்கை விஞ்ஞான சேவை | **Sri Lanka Scientific Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | இலங்கை கமத்தொழில் சேவை | **Sri Lanka Agricultural Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය සේවය | இலங்கை கால் நடை உற்பத்திகள் மற்றும் சுகாதார சேவை | **Sri Lanka Animal Production & Health Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා සැලසුම් සේවය | இலங்கை திட்டமிடல் சேவை | **Sri Lanka Planning Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | இலங்கை கணக்காளர் சேவை | **Sri Lanka Accountants Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | இலங்கை கல்வி நிர்வாக சேவை | **Sri Lanka Educational Administrative Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය | இலங்கை ஆசிரியர் கல்விச் சேவை | **Sri Lanka Teacher Educators' Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | இலங்கை கட்டிடக் கலைஞர் சேவை | **Sri Lanka Architects Service** | SL 1-2006 |
| ශ්‍රී ලංකා විගණන සේවය | இலங்கை கணக்காய்வுச் சேவை | **Sri Lanka Audit Service** | |
| I පන්තිය I ශ්‍රේණිය, | வகுப்பு 1 தரம் 1 | Class I Grade I | SL 1-2006 step 22 |
| I පන්තිය II ශ්‍රේණිය, II පන්තිය I ශ්‍රේණිය, II පන්තිය II ශ්‍රේණිය, | வகுப்பு 1 தரம் 11, வகுப்பு 11 தரம் 1 வகுப்பு 11 தரம் 11 | Class I Grade II, Class II Grade I, Class II Grade II | SL 1-2006 |
| ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය | இலங்கை கணக்காய்வு பரீட்சகர் சேவை | **Sri Lanka Audit Examiners Service** | |
| I ශ්‍රේණිය, II ශ්‍රේණිය | தரம் 1, தரம் 11 | Grade I, Grade II | MN 5-2006 |
| ශ්‍රී ලංකා විදේශ සේවය | இலங்கை க்டல் கடந்த சேவை | **Sri Lanka Overseas Service** | |
| ශ්‍රී ලංකා විදේශ සේවයෙන් තෝරා ගත් තානාපතිවරුන් | இலங்கை க்டல் கடந்த சேவையிலிருந்து தெரிவு செய்து கொண்ட தூதுவர்கள் | Ambassadors selected from SLOS | SL 1-2006 step 26 |
| I ශ්‍රේණිය | தரம் 1 | Grade I | SL 1-2006 step 21 |
| II ශ්‍රේණිය | தரம் 11 | Grade II | SL 1-2006 step 13 |

| | | | |
|---|---|---|---|
| III ශ්‍රේණිය | தரம் 111 | Grade III | SL 1-2006 |
| **ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය** | **இலங்கை உள்நாட்டு இறைவரிச் சேவை** | **Sri Lanka Inland Revenue Service** | |
| කොමසාරිස් ජනරාල් | ஆணையாளர் அதிபதி | Commissioner General | SL 3-2006 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | சிரேஸ்ட பிரதி ஆணையாளர் அதிபதி | Senior Dy. Commissioner General | SL 1-2006 step 25 |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | பிரதி ஆணையாளர் அதிபதி | Dy. Commissioner General | SL 1-2006 step 21 |
| I පන්තිය, II පන්තිය I ශ්‍රේණිය, II පන්තිය II ශ්‍රේණිය, | வகுப்பு 1, வகுப்பு 11 ,தரம் 1, வகுப்பு 11 தரம் 11 | Class I, Class II Grade I, Class II Gr II | SL 1-2006 |
| III පන්තිය I ශ්‍රේණිය, III පන්තිය II ශ්‍රේණිය, | வகுப்பு 111 தரம் 1, வகுப்பு 111 தரம் 11 | Class III Grade I, Class III Grade II | MN 5-2006 |
| **වෛද්‍ය නිලධාරීන්** | **மருத்துவ அலுவலர்கள்** | **Medical Officers** | |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | சுகாதார சேவைகள் பணிப்பாளர் அதிபதி | Director General Health Services | SL 3-2006 |
| නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | பிரதி சுகாதார சேவைகள் பணிப்பாளர் அதிபதி | Deputy Director General Health Services | SL 3-2006 |
| විශේෂඥ වෛද්‍යවරු | மருத்துவ நிபுணர்கள் | Specialists | SL 3-2006 |
| වෛද්‍ය නිලධාරීන් - පරිපාලන ශ්‍රේණිය | மருத்துவ அலுவலர்கள் நிர்வாகத் தரம் | Medical Officers - Administrative Grade | SL 1-2006 step 20 |
| වෛද්‍ය නිලධාරීන් - I ශ්‍රේණිය, | மருத்துவ அலுவலர்கள் தரம் 1 | Medical Officers - Grade I | SL 2-2006 |
| වෛද්‍ය නිලධාරීන් - I I ශ්‍රේණිය, | மருத்துவ அலுவலர்கள் தரம் 11 | Medical Officers - Grade II | SL 2-2006 |
| ප්‍රාථමික ශ්‍රේණිය | ஆரம்பத் தரம் | Preliminary Grade | SL 2-2006 |
| දන්ත ශල්‍ය වෛද්‍ය I ශ්‍රේණිය, | பல் சிகிச்சை மருத்துவர் - தரம் 1 | Dental Surgeon - Grade I | SL 2-2006 |
| දන්ත ශල්‍ය වෛද්‍ය II ශ්‍රේණිය, | பல் சிகிச்சை மருத்துவர் - தரம் 11 | Dental Surgeon - Grade II | SL 2-2006 |
| **ශ්‍රී ලංකා පොලීසිය** | **இலங்கை பொலிஸ்** | **Sri Lanka Police** | |
| පොලිස්පති | பொலிஸ் மா அதிபர் | Inspector General of Police | SL 3-2006 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | சிரேஸ்ட பிரதி பொலிஸ் மா அதிபர் | Senior Deputy Inspector General of Police | SL 1-2006 Step 25 |
| නියෝජ්‍ය පොලිස්පති | பிரதிப் பொலிஸ்மா அதிபர் | Deputy Inspector General of Police | SL 1-2006 Step 22 |
| පොලිස් අධිකාරී - I ශ්‍රේණිය, | ¦பொலிஸ் அத்தியட்சகர் தரம் 1 | Superintendent of Police - Grade I | SL 1-2006 Step 12 |
| පොලිස් අධිකාරී - II ශ්‍රේණිය, | ¦பொலிஸ் அத்தியட்சகர் தரம் 1 | Superintendent of Police - Grade II | SL 1-2006 Step 8 |
| සහකාර පොලිස් අධිකාරී | ¦உதவி பொலிஸ் அத்தியட்சகர் | Assistant Superintendent of Police | SL 1-2006 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | பிரதம பொலிஸ் பரிசோதகர் | Chief Inspector of Police | RS 2-2006 |
| පොලිස් පරීක්ෂක | பொலிஸ் பரிசோதகர் | Inspector of Police | RS 2-2006 |
| උප පොලිස් පරීක්ෂක | உதவி பொலிஸ் பரிசோதகர் | Sub Inspector of Police | RS 2-2006 |
| ප්‍රධාන සැරයන් | பிரதம சாரஜன் | Sergeant Major | RS 2-2006 |
| පොලිස් සැරයන් | பொலிஸ் சாஜன் | Police Sergeant | RS 1-2006 |
| පොලිස් කොස්තාපල් | பொலிஸ் கொன்ஸ்டபள் | Police Constable | RS 1-2006 |
| **ශ්‍රී ලංකා රේගුව** | **இலங்கை சுங்கம்** | **Sri Lanka Customs** | |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | சுங்கப் பணிப்பாளர் அதிபதி | Director General of Customs | SL 3-2006 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ ජනරාල් | பிரதி சுங்கப் பணிப்பாளர் அதிபதி | Dy. Director General of Customs | SL 3-2006 |
| රේගු අධ්‍යක්ෂ | சுங்கப் பணிப்பாளர் | Director of Customs | SL 1-2006 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | பிரதி சுங்கப் பணிப்பாளர் அதிபதி | Deputy Director of Customs | SL 1-2006 |
| සහකාර රේගු අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුව) | உதவி சுங்கப் பணிப்பாளர் திணைக்களப் பதவி | Assistant Director of Customs | SL 1-2006 Step 9 |

| | | | |
|---|---|---|---|
| | | (Departmental) | |
| රේගු අධිකාරී | சுங்க அத்தியட்சகர் | Superintendent of Customs | SL 1-2006 |
| සහකාර රේගු අධිකාරී I පන්තිය, II පන්තිය, | உதவி சுங்க அத்தியட்சகர் வகுப்பு 1 , வகுப்பு 11 | Asst. Superintendent of Customs Class I, Class II | MN 5-2006 |
| ප්‍රධාන රේගු පරීක්ෂක | பிரதான சுங்கப் பரிசோதகர் | Chief Inspector of Customs | RS 2-2006 |
| රේගු පරීක්ෂක I ශ්‍රේණිය, II ශ්‍රේණිය, | சுங்கப் பரிசோதகர் தரம் 1 தரம் 11 | Inspector of Customs Grade I, Grade II | RS 1-2006 |
| **ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය** | **இலங்கை நில அளவைச் சேவை** | **Sri Lanka Surveyors' Service** | |
| මිනුම්පති සහ අතිරේක මිනුම්පති | நில அளவை அதிபதி மற்றும் மேலதிக நில அளவை அதிபதி | Surveyor General & Addl. Surveyor General | SL 3-2006 |
| I පන්තිය/ II පන්තිය/ I ශ්‍රේණිය සහ II ශ්‍රේණිය | வகுபபு 1/ வகுப்பு11/தரம் 1 மற்றும் தரம் 11 | Class I, Class II Grade I & Grade II, | SL1-2006 |
| ආධුනික මිනින්දෝරු | பயிலுநர் அளவையாளர் | Apprentice Surveyor | MN 5-2006 |
| **මිනුම්දෝරු දෙපාර්තමේන්තුව** | **நில அளவைத் திணைக்களம்** | **Surveyor's General Department** | |
| ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී | பிரதான தொழில் நுட்பம் மற்றும் நிர்வாக அலுவலர் | Chief Technical & Administrative Officer | SL 1-2006 step 5 |
| කාර්මික හා පරිපාලන නිලධාරී | தொழில் நுட்ப மற்றும் நிர்வாக உத்தியோகத்தர் | Technical & Administrative Officer | MN 7-2006 step 3 |
| සිතියම් නිෂ්පාදන නිලධාරී | அளவைப் பட தயாரிப்பு அலுவலர் | Map Production Officer | MN 7-2006 step 3 |
| ඡායා රේඛණ මිතිඥ | புகைப் பட பதிவாளர் | Photogramertrist | MN 7-2006 |
| නැවිගේටර් | நெவிகேற்றர் | Navigator | MN 7-2006 |
| **ලියාපදිංචි/සහකාර වෛද්‍ය නිලධාරීන්** | **பதிவி செய்யப்பட்ட துணைச் சேவை மருத்துவ அலுவலர்கள்** | **Registered / Assistant Medical Officers** | |
| විශේෂ ශ්‍රේණිය | விசேட தரம் | Special Grade | MP 2-2006 |
| I ශ්‍රේණිය සහ II ශ්‍රේණිය | தரம் 1 மற்றும் தரம் 11 | Grade I, Grade II | MP 1-2006 |
| **ඒකාබද්ධ තැපැල් සේවය** | **இணைந்த அஞ்சல் சேவை** | **Unified Postal Service** | |
| තැපැල්පති | அஞ்சல் அதிபதி | Postmaster General | SL 3-2006 |
| ඒ.තැ.සේ. අ කාණ්ඩය, I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය අ ඛණ්ඩය | இ. அ. சே, தொ. அ தரம் 1, தரம் 11, தரம் 11 பிரிவு அ | UPS Group A Grade I, Grade II, Grade III Seg A | SL 1-2006 |
| ඒ.තැ.සේ. අ කාණ්ඩය, III ශ්‍රේණිය ආ ඛණ්ඩය, ආ කාණ්ඩය I ශ්‍රේණිය, II ශ්‍රේණිය, | இ. அ. சே, தொ. அ தரம் 111 பிரிவு ஆ தரம் பிரிவு ஆ பிரிவு ஆ தரம் 1. தரம் 11 | UPS Group A Grade III Seg B, Group B Grade I, Grade II | MN 3-2006 |
| ශ්‍රී ලංකා උප තැපැල් ස්ථානාධිපති සේවය | இலங்கை உப அஞ்சல் அதிபர் சேவை | Sri Lanka Sub Postmasters' Service | MN 1-2006 |
| ඒ.තැ.සේ. ඇ කාණ්ඩය, I ශ්‍රේණිය, | இ.உ.அ.சே. தொகுதி இ . தரம் 1 | UPS Group C Grade I | PL 1-2006 step 22 |
| ඒ.තැ.සේ. ඇ කාණ්ඩය, II ශ්‍රේණිය, | இ.உ.அ.சே. தொகுதி இ . தரம் 11 | UPS Group C Grade II | PL 1-2006 step 12 |
| ඒ.තැ.සේ. ඇ කාණ්ඩය, III ශ්‍රේණිය, | இ.உ.அ.சே. தொகுதி இ . தரம் 111 | UPS Group C Grade III | PL 1-2006 step 4 |
| | | | |
| **ශ්‍රී ලංකා මුද්‍රණ සේවය** | **இலங்கை அச்சகச் சேவை** | **Sri Lanka Printing Service** | |
| රජයේ මුද්‍රණාලයාධිපති, | **இலங்கை அச்சக அதிபதி** | Government Printer | SL 3-2006 |
| I පන්තිය I ශ්‍රේණිය | வகுப்பு 1 தரம் 1 | Class I Gr I | PL 1-2006 step 20 |
| I පන්තිය II ශ්‍රේණිය | வகுப்பு 1 தரம் 11 | Class I Gr II, | PL 1-2006 step 12 |
| II පන්තිය I ශ්‍රේණිය | வகுப்பு 11 தரம் 1 | Class II Gr I | PL 1-2006 step 6 |
| II පන්තිය II ශ්‍රේණිය | வகுப்பு 11 தரம் 11 | Class II Gr II | MN 5-2006 |
| පුහුණුවන ශාඛා භාර අධිකාරී | கிளை அத்தியட்சகர் பயிற்சி | Branch Superintendents Trainee | MN 4-2006 |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | அரச முகாமை உதவியாளர் சேவை | Public Management Assistants Service | |
| අධි පන්තිය | அதி உயர் வகுப்பு | Supra Class | MN 7-2006 |
| I පන්තිය II පන්තිය III පන්තිය | வகுப்பு 1 வகுப்பு 11 வகுப்பு 11 | Class I, Class II, Class III | MN 2-2006 |
| භාෂා පරිවර්තක සේවය | மொழி பெயர்ப்பாளர் சேவை | Translators Service | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Class | MN 6-2006 step 23 |
| I පන්තිය | வகுப்பு 1 | Class I | MN 6-2006 step 12 |
| දුම්රිය ස්ථානාධිපති සේවය | புகையிரத நிலைய பொறுப்பதிகாரி சேவை | Railway Station Masters' Service | |
| දුම්රිය ස්ථාන අධිකාරි සහ බඩු ගබඩා නිලධාරි | புகையிரத நிலைய அத்தியட்சகர் மற்றும் பொருட் களஞ்சிய அலுவலர் | Station Superintendent & Goods Agent | MN 7-2006 Step 4 |
| දුම්රිය ස්ථානාධිපති-අධි ශ්‍රේණිය, I පන්තිය හා II | புகையிரத நிலையப் பொறுப்பதிகாரி அதி உயர் தரம் , வகுப்பு 1 மற்றும் வகுப்பு 11 | Station Master Supra, Class I & II | MN 3-2006 |
| ග්‍රාම නිලධාරි | கிராம அலுவலர் | Grama Niladharis | |
| අධි ශ්‍රේණිය | அதிஉயர் தரம் | Supra Class | MN 7-2006 |
| I පන්තිය | வகுப்பு 1 | Class I | MN 1-2006 step 17 |

| | | | |
|---|---|---|---|
| II පන්තිය | வகுப்பு 11 | Class II | MN 1-2006 step 6 |
| **කම්කරු නිලධාරී** | தொழில் அலுவலர் | **Labour Officers** | |
| **I පන්තිය,** II පන්තිය | வகுப்பு 1 வகுப்பு 11 | Class I, Class II | MN 5-2006 |
| **පරිවාස නිලධාරීන්** | நன்னடத்தை அலுவலர்கள் | **Probation Officers** | |
| I පන්තිය, II පන්තිය | வகுப்பு 1 வகுப்பு 11 | Class I, Class II | MN 5-2006 |
| **ශ්‍රී ලංකා ගුරු සේවය** | இலங்கை ஆசிரியர் சேவை | **Sri Lanka Teachers Service** | |
| පන්තිය 3 - II | வகுப்பு 3 -11 | Class 3-II | TS 1-2006 |
| පන්තිය 3 -I , 2 - II, 2 - I, 1 | வகுப்பு 3 -1, 2 -11, 2-1, 1 | Class 3-I, 2-II, 2-I, 1 | TS 2-2006 |
| **ශ්‍රී ලංකා විදුහල්පති සේවය** | இலங்கை அதிபர் சேவை | **Sri Lanka Principals Service** | |
| ශ්‍රේණිය III, II - II, II - I, I | தரம் 111, 11- 11,11 - 1,1 | Grade III, II-II, II-I, I | TS 3-2006 |
| **ශ්‍රී ලංකා තාක්ෂණ සේවය** | இலங்கை தொழில்நுட்பவியல் சேவை | **Sri Lanka Technological Service** | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Grade | MN 7-2006 |
| I පන්තිය, II පන්තිය අ බණ්ඩය, II පන්තිය ආ බණ්ඩය, | வகுப்வு 1, வகுப்பு 11, பிரிவு அ , வகுப்பு 11 | Class I, Class II A, Class II B | MT 2-2006 |
| **පුහුණුවන කළමණාකරණ සහකාර කාර්මික ශ්‍රේණිය** | முகாமை உதவியாளர் தொழில் நுட்ப பயிற்சி தரம் | **Trainee Management Assistant Technical Groups** | MN 1-2006 |
| **වැටුප් බණ්ඩ ටී.බී. 2 - 5 -2 යටතේ බඳවා ගත් උපාධිධාරීන්** | சம்பளத் தொகுதி ரிபி 2 – 5 – 2 இன் கீழ் சேர்த்துக் கொள்ளப்பட்ட | **Graduates Recruited on Salary Group TB 2-5-2** | MN 4-2006 |
| **ඌන සේවා උපාධිධාරීන් (රා.ප.ච.ලේඛ 20/94 යටතේ)** | கீழுழைப்புச் சேவைப் பட்டதாரிகள் (அ.நி.சு, இல 20/94 இன் கீழ் | **Under employed Graduates (PA circular 20/94 referred)** | MN 4-2006 step 23 |
| **නුපුහුණු කම්කරු ශ්‍රේණි** | பயிற்றப்படாத தோழிலாளர் தரங்கள் | **Labour Grades Unskilled** | PL 1-2006 |
| **කම්කරු ශ්‍රේණි අර්ධ පුහුණු හා පුහුණු(නිර්වචනය නොකරන ලද)** | தொழிலாளர் தரங்கள் பகுதிப் பயிற்சி மற்றும் பயிற்சி (வரைவிலக்கணப்படுத்தாத) | **Labour Grades Semi-skilled & Skilled (undefined)** | Refer to NSCC |
| **මෝටර් රථ රියදුරන්** | மோட்டார் வாகனச் சாரதிகள் | **Drivers of Motor Vehicles** | PL 3-2006 |
| **ගබඩා භාර ලිපිකරුවන් හා ගබඩා ලිපිකරුවන්** | பண்ணடகசாலை பொறுப்பு எழுதுநர்களும் பண்டசாலை எழுதுநர்களும் | **Store Keeper Clerks & Store Clerks** | MN 1-2006 |
| **දත්ත සටහන් ක්‍රියාකරු** | தரவுப் பதிவு இயக்குநர் | **Data Entry Operator** | MN 1-2006 |
| **පුස්තකාලයාධිපතිවරුන්** | நுலகர்கள் | **Librarians** | |
| අධි ශ්‍රේණිය | அதி உயர் தரம் | Supra | MN 7-2006 |
| ශ්‍රේණිය I , II, III, උපාධිධාරීන් | தரம் 1, 11, 11 பட்டதாரிகள் | Grade I, II, III Graduates | MN 4-2006 |
| උපාධිධාරීන් නොවන පුස්තකාලයාධිපතිවරුන් | பட்டதாரிகள் அல்லாத நூலகர்கள் | Librarians non graduates | MN 3-2006 |

| | | | |
|---|---|---|---|
| සුභසාධක නිලධාරීන් | நலன்புரி அலுவலர்கள் | **Welfare Officers** | |
| ශ්‍රේණිය I, II, | தரம் 1,11 | Grade I, II | MN 1-2006 step 6 |
| හෙද නිලධාරීන් | | **Nursing Officers** | |
| විශේෂ පන්තිය | | Special Class | MT 8-2006 step 4 |
| I පන්තිය, II අ , II ආ | | Class I, Class II A & B | MT 7 -2006 |
| දන්ත කාර්මික ශිල්පි, කීට විද්‍යා සහකාර, අක්ෂි විද්‍යා සහායක, පාසැල් දන්ත චිකිත්සක | பல் தொழில்நுட்பவியலர் பூச்சியல் உதவியாளர் கண் அறிவியல் உதவியாளர் , பாடசாலை பல் சிகிச்சை செய்பவர் | **Dental Technicians, Entomological Assistants, Ophthalmic Assistants, School Dental Technicians** | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Class | MT 8-2006 step 3 |
| I පන්තිය, II අ , II ආ | வகுப்பு 1, 11 அ, 11 ஆ | Class I, Class II A & B | MT 6-2006 |
| | | | |

| | | | |
|---|---|---|---|
| II පන්තිය | வகுப்பு 11 | Class II | MN 1-2006 step 6 |
| කම්කරු නිළධාරී | தொழில் அலுவலர் | **Labour Officers** | |
| I පන්තිය, II පන්තිය | வகுப்பு 1 வகுப்பு 11 | Class I, Class II | MN 5-2006 |
| පරිවාස නිළධාරීන් | நன்னடத்தை அலுவலர்கள் | **Probation Officers** | |
| I පන්තිය, II පන්තිය | வகுப்பு 1 வகுப்பு 11 | Class I, Class II | MN 5-2006 |
| ශ්‍රී ලංකා ගුරු සේවය | இலங்கை ஆசிரியர் சேவை | **Sri Lanka Teachers Service** | |
| පන්තිය 3 - II | வகுப்பு 3 –11 | Class 3-II | TS 1-2006 |
| පන්තිය 3 -I , 2 - II, 2 - I, 1 | வகுப்பு 3 –1, 2 –11, 2–1, 1 | Class 3-I, 2-II, 2-I, 1 | TS 2-2006 |
| ශ්‍රී ලංකා විදුහල්පති සේවය | இலங்கை அதிபர் சேவை | **Sri Lanka Principals Service** | |
| ශ්‍රේණිය III, II - II, II - I, I | தரம் 111, 11– 11,11 – 1,1 | Grade III, II-II, II-I, I | TS 3-2006 |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | இலங்கை தொழில்நுட்பவியல் சேவை | **Sri Lanka Technological Service** | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Grade | MN 7-2006 |
| I පන්තිය, II පන්තිය අ බණ්ඩය, II පන්තිය ආ බණ්ඩය, | வகுப்வு 1, வகுப்பு 11, பிரிவு அ , வகுப்பு 11 | Class I, Class II A, Class II B | MT 2-2006 |
| පුහුණුවන කළමණාකරණ සහකාර කාර්මික ශ්‍රේණිය | முகாமை உதவியாளர் தொழில் நுட்ப பயிற்சி தரம் | **Trainee Management Assistant Technical Groups** | MN 1-2006 |
| වැටුප් බණ්ඩ ටී.බී. 2 - 5 -2 යටතේ බඳවා ගත් උපාධිධාරීන් | சம்பளத் தொகுதி ரிபி 2 – 5 – 2 இன் கீழ் சேர்த்துக் கொள்ளப்பட்ட | **Graduates Recruited on Salary Group TB 2-5-2** | MN 4-2006 |
| ඌන සේවා උපාධිධාරීන් (රා.ප.ව.ලේඛ 20/94 යටතේ) | கீழுழைப்புச் சேவைப் பட்டதாரிகள் (அ.நி.சு, இல 20/94 இன் கீழ் | **Under employed Graduates (PA circular 20/94 referred)** | MN 4-2006 step 23 |
| නුපුහුණු කම්කරු ශ්‍රේණි | பயிற்றப்படாத தோழிலாளர் தரங்கள் | **Labour Grades Unskilled** | PL 1-2006 |
| කම්කරු ශ්‍රේණි අර්ධ පුහුණු හා පුහුණු(නිර්වචනය නොකරන ලද) | தொழிலாளர் தரங்கள் பகுதிப் பயிற்சி மற்றும் பயிற்சி (வரைவிலக்கணப்படுத்தாத) | **Labour Grades Semi-skilled & Skilled (undefined)** | Refer to NSCC |
| මෝටර් රථ රියදුරන් | மோட்டார் வாகனச் சாரதிகள் | **Drivers of Motor Vehicles** | PL 3-2006 |
| ගබඩා භාර ලිපිකරුවන් හා ගබඩා ලිපිකරුවන් | பண்ணடகசாலை பொறுப்பு எழுதுநர்களும் பண்டசாலை எழுதுநர்களும் | **Store Keeper Clerks & Store Clerks** | MN 1-2006 |
| දත්ත සටහන් ක්‍රියාකරු | தரவுப் பதிவு இயக்குநர் | **Data Entry Operator** | MN 1-2006 |
| පුස්තකාලයාධිපතිවරුන් | நுலகர்கள் | **Librarians** | |
| අධි ශ්‍රේණිය | அதி உயர் தரம் | Supra | MN 7-2006 |
| ශ්‍රේණිය I , II, III, උපාධිධාරීන් | தரம் 1, 11, 11 பட்டதாரிகள் | Grade I, II, III Graduates | MN 4-2006 |
| උපාධිධාරීන් නොවන පුස්තකාලයාධිපතිවරුන් | பட்டதாரிகள் அல்லாத நூலகர்கள் | Librarians non graduates | MN 3-2006 |

| | | | |
|---|---|---|---|
| පවුල් සෞඛ්‍ය සේවිකා (වින්නඹු), මහජන සෞඛ්‍ය පරීක්ෂක | குடும்ப சுகாதார சேவை உத்தியோகத்தர், பொதுச் சுகாதார பரிசோதகர் | **Family Health Workers (Midwives), Public Health Inspectors** | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Class | MT 8-2006 step 2 |
| I පන්තිය, II අ II ආ | வகுப்பு 1, 11 அ, 11 ஆ | Class I, Class II A & B | MT 5-2006 |
| විදුලුත් නිකර්පන සටහන්කරු, විදුලුත් බන්තු රේඛණ සටහන්කරු, මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | ஈ ஈ ஜீ மின்சார முளை இயக்க பதிவாளர் ஈ சீ ஜீ மின்சார இருதய துடிப்பு பதிவளார் மக்கள் சுகாதார இரசயான கூட தொழில் நுட்பவியலாளர் | **EEG Recordists, ECG Recordists, Public Health Lab-Technicians** | |
| විශේෂ පන්තිය | விசேட வகுப்பு | Special Class | MT 8-2006 |
| I පන්තිය, II අ , II ආ | வகுப்பு 1, 11 அ, 11 ஆ | Class I, Class II A & B | MT 4-2006 |
| **සමුපකාර සංවර්ධන** | **கூட்டுறவு அபவிருத்தி** | **Co-operative Development** | |
| සමුපකාර සංවර්ධන උප කොමසාරිස් | கூட்டுறவு அபிவிருத்தி உப ஆணையாளர் | Assistant Commissioner Co-operative Development | SL 1-2006 |
| දිස්ත්‍රික් නිලධාරී | மாவட்ட அலுவலர் | District Officer | MN 7-2006 |
| සමුපකාර සමිති පරීක්ෂකI පන්තිය, IIඅ , IIආ | கூட்டுறவுச் சங்க பரி சோதகர் வகுப்பு 1, 11 அ, 11 ஆ | Co-operative Inspector Class I, IIA & IIB | MN 1-2006 |
| **උප ලේඛණගත රජයේ නිලධාරීන්ගේ සේවය (උසාවි කාර්ය මණ්ඩලය)** | **அட்டவணைப்படுத்தப்பட்ட அரச அலுவலர்களின் சேவை (நீதிமன்ற பணித் தொகுதி)** | **Scheduled Public Service (Courts Staff)** | |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | உச்ச நீதிமன்ற பதிவாளர் | Registrar of Supreme Court | SL 1-2006 step 14 |
| අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් | மேன் முறையீட்டு நீதிமன்ற பதிவாளர் | Registrar of Court of Appeal | SL 1-2006 step 12 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | உச்ச நீதிமன்ற பிரதிப் பதிவாளர் | Deputy Registrar of Supreme Court | SL 1-2006 step 12 |
| අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | மேன்முறையீட்டு நீதி மன்ற பிரதிப் பதிவாளர் | Deputy Registrar of Court of Appeal | SL 1-2006 step 8 |
| අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 1 ශ්‍රේණිය | நீதிமன்றப் பதிவாளர் சேவை தரம் 1 | Court Registrar Service Gr. I | SL 1-2006 step 8 |
| අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 11 ශ්‍රේණිය | நீதிமன்றப் பதிவாளர் சேவை தரம் 11 | Court Registrar Service Gr. II | SL 1-2006 step 3 |
| අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 111 ශ්‍රේණිය | நீதிமன்றப் பதிவாளர் சேவை தரம் 111 | Court Registrar Service Gr. III | MN 7-2006 step 3 |
| අධිකරණ ලිපිකරු 1 ශ්‍රේණිය | நீதிமன்ற எழுதுநர் தரம் 1 | Courts Clerk Gr.I , | MN 1-2006 step 25 |
| අධිකරණ ලිපිකරු 11 ශ්‍රේණිය | நீதிமன்ற எழுதுநர் தரம் 11 | Courts Clerk Gr II | MN 1-2006 step 16 |
| අධිකරණ ලිපිකරු බඳවා ගැනීමේ ශ්‍රේණිය | நீதிமன்ற எழுதுநர் ஆட்சேர்ப்புத் தரம் | Courts Clerk Recruitment Grade | MN 1-2006 step 14 |
| අධිකරණ භාෂණ පරිවර්තක සේවය 1 ශ්‍රේණිය | நிதிமனற உரைபெயர்ப்பாளர் சேவை தரம் 1 | Courts Interpreter Gr.I , | MN 1-2006 step 24 |
| අධිකරණ භාෂණ පරිවර්තක සේවය 11 ශ්‍රේණිය | நிதிமனற உரைபெயர்ப்பாளர் சேவை தரம் 11 | Courts Interpreter Gr. II | MN 1-2006 step 19 |
| අධිකරන ප්‍රධාන ලඝු ලේඛක | நிதிமனற பிரதம சுருக்கெழுத்தளர் | Courts Chief Stenographer | MN 7-2006 step 3 |
| අධිකරණ ලඝු ලේඛක 1 ශ්‍රේණිය | நிதிமனற சுருக்கெழுத்தளர் தரம் 1 | Courts Stenographer Gr.I | MN 1-2006 step 22 |
| අධිකරණ ලඝු ලේඛක 11 ශ්‍රේණිය | நிதிமனற சுருக்கெழுத்தளர் தரம் 11 | Courts Stenographer Gr. II | MN 1-2006 step 14 |

| | | | |
|---|---|---|---|
| අධිකරණ යතුරු ලේඛක 1 ශ්‍රේණිය | நிதிமனற தட்டெழுத்தாளர் தரம் 1 | Courts Typist Gr.I | MN 1-2006 step 25 |
| අධිකරණ යතුරු ලේඛක 11 ශ්‍රේණිය | நிதிமனற தட்டெழுத்தாளர் தரம் 11 | Courts Typist Gr. II | MN 1-2006 step 12 |
| අධිකරණ පොත් බැඳුම්කරු | நீதிமன்ற புத்தகம் கட்டுநர் | Courts Book Binder | PL 2-2006 |
| **ශ්‍රී ලංකා මැනුම් සහයක සේවය** | **இலங்கை நில அளவை உதவியாளர் சேவை** | **Sri Lanka Manum Sahayaka Service** | |
| 1 පන්තිය 1 ශ්‍රේණිය, 11 ශ්‍රේණිය, 11 පන්තිය, 111 පන්තිය | வகுப்பு 1, தரம் 1 , தரம் 11 வகுப்பு 11, 111 | Class I Gr I, Class I Gr II, Class II, Class III | PL I-2006 |
| **බන්ධනාගාර දෙපාර්තමේන්තුව** | **சிறைச்சாலைத் திணைக்களம்** | **Department of Prisons** | |
| කොමසාරිස් ජනරාල් | ஆணையாளர் அதிபதி | Commissioner General | SL 3-2006 |
| කොමසාරිස් | ஆணையாளர் | Commissioners | SL 1-2006 |
| අධිකාරි විශේෂ ශ්‍රේණිය | அத்தியட்சகர் விசேட தரம் | Superintendents Spl Grade | SL 1-2006 Step 6 |
| අධිකාරි | அத்தியட்சகர் | Superintendents | SL 1-2006 Step 10 |
| සහකාර අධිකාරි | உதவி அத்தியட்சகர் | Asst. Superintendents | MN 5-2006 step 12 |
| ප්‍රධාන ජේලර්, ජේලර් 1, ජේලර් 11 | பிரதம ஜெய்லர் , ஜெய்லர் 1, ஜெய்லர் 11 | Chief Jailor, Jailor I, Jailor II | RS 2-2006 |
| ප්‍රධාන ඕවර්සියර්, ඕවර්සියර්, නියාමක | பிரதம மேற்பார்வையளார் , மேற்பார்வையாளர் பாதுகாவலர் | Chief Overseer, Overseers, Guards | RS 1-2006 |

Please Note that above table is purely for the purpose of absorption of the present cadre. The salary step at the recruitment shall be the initial step or any other defined step of the salary scale applicable to the respective service / category in terms of the Scheme of Recruitment.

ඉහත සඳහන් වගුව හුදෙක්ම දැනට සේවයේ යෙදී සිටින තැනැත්තන් **අන්තර්ග්‍රහණය කිරීමේ කාර්යයට** පමණක් සීමා වන බව සටහන් කර ගත යුතුය. බඳවා ගැනීම්/පත් කිරීම් සිදු කරන අවස්ථාවේදී ලබා දිය යුතු වන වන වැටුප් පියවර වනුයේ අදාල සේවා කාණ්ඩය/ගණය සඳහා මෙහි සලස්වා දී ඇති වැටුප් පරිමාණයෙහි ආරම්භක පියවර හෝ බඳවා ගැනීමේ පරිපාටියෙහි සුවිශේෂ කොට දක්වා ‍ඇති වෙනත් යම් පියවරක් වේ නම් එම වැටුප් පියවර වේ.

மேற்பொந்த அட்டவணை வெறுமனே தற்போது சேவையில் இருப்பவர்களை உள்ளீர்ப்பு செய்யும் அலுவல்களுக்காக மட்டும் வரையறுக்கப்படுகிறது என்பதை குறித்துக் கொள்ள வேண்டும். ஆட்சேர்ப்புக்கள் / நியமனங்களை செய்யும் பட்சத்தில் வழங்க வேண்டிய சம்பளப்படி நிலையாவது, உரிய சேவைத் தொகுதி/வகுதிக்காக இங்கு ஏற்பாடு செய்துள்ள சம்பள அளவுத் திட்டத்தின் தொடக்க படி நிலை அல்லது ஆட்சேர்ப்புத் திட்டத்தில் விசேடமாக காட்டப்பட்டுள்ள வேறு ஏதேனும் ஒரு படி நிலை இருப்பின் அப்படிநிலையாகும்.